- 6 JUL 2005
කෑ. පෙ, 1522
කොළඹ.

# 2001
# වාර්ෂික වාර්තාව

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා
පුහුණු කිරීමේ ආයතනය,
114, විජේරාම මාවත,
කොළඹ - 07,
ශ්‍රී ලංකාව.

HARTI Annual Report Sinhala, 2001

# 2001
# වාර්ෂික වාර්තාව

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා
පුහුණු කිරීමේ ආයතනය,
114, විජේරාම මාවත,
කොළඹ - 07,
ශ්‍රී ලංකාව.

# පාලක මණ්ඩලය

| | | |
|---|---|---|
| ආනන්ද එස්. ගුණසේකර මහතා | - | සභාපති පාලක මණ්ඩලය සහ ලේකම් කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය (2001-10-15 දින සිට) |
| ආචාර්ය ඇස්.ජී. සමරසිංහ | - | අධ්‍යක්ෂ, හෙක්ටර් කොබ්බැකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය (1993-12-15 දින සිට) |
| සී. මාලියද්ද මහතා | - | නියෝජ්‍ය, මුදල්, ප්‍රතිපත්ති සැලසුම් වාර්ගික කටයුතු සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය (1999-03-01 දින සිට) |
| මාලනී වඩුවෙගෙදර මිය | - | නියෝජ්‍ය, වාරිමාර්ග, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය (2000-12-01 දින සිට) |
| ජී.බී.එස්. ලියනගේ මහතා | - | නියෝජ්‍ය, අභ්‍යන්තර හා බාහිර වෙළඳ, වානිජ හා ආහාර අමාත්‍යාංශය (2000-12-05 දින සිට) |
| ආචාර්ය යූ. විදානපතිරණ | - | නියෝජ්‍ය, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය (1999-04-05 දින සිට) |
| පී.ඩබ්. සෙනවිරත්න මහතා | - | නියෝජ්‍ය, වෘත්තීය පුහුණු හා ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය (1999-05-25 දින සිට) |
| ඒ.එම්. චන්ද්‍රපාල මහතා | - | නියෝජ්‍ය, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය (2000-02-11 දින සිට) |
| ආචාර්ය අනිලා ඩයස් බණ්ඩාරනායක | - | නියෝජ්‍ය, ශ්‍රී ලංකා මහ බැංකුව (2000-11-10 දින සිට) |
| ආචාර්ය එස්.ඩී.ජේ. ජයවර්ධන | - | කෘෂිකර්ම අධ්‍යක්ෂ ජෙනරාල් (1995-09-25 සිට) |
| මහාචාර්ය ටී.ආර්.එන්. ගුණවර්ධන | - | නියෝජ්‍ය, කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය |
| එස්. පුස්සේපිටිය මහතා | - | ගොවිජන සේවා කොමසාරිස් (1997-09-30 සිට) |
| ඩබ්.පී. පීනදාස මහතා | - | වාරිමාර්ග අධ්‍යක්ෂ ජෙනරාල් (1999-11-04 සිට) |
| ජී.එස්.එල්. පොන්සේකා මහතා | - | සමුපකාර සංවර්ධන කොමසාරිස්(2000-07-18 සිට) |
| මාස්ලාන් ජූසෝ මහතා | - | නේවාසික නියෝජ්‍ය - ආහාර හා කෘෂිකර්ම සංවිධානය |
| ආර්. ද සිල්වා මහත්මිය | - | ලේකම්, පාලක මණ්ඩලය (1992-06-15 දින සිට) |

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා
පුහුණුකිරීමේ ආයතනය,
114, විජේරාම මාවත,
කොළඹ - 07.
2002-10-03.

ගරු කෘෂිකර්ම, පශු සම්පත් හා සමෘද්ධි අමාත්‍යතුමා,
කෘෂිකර්ම, පශු සම්පත් හා සමෘද්ධි අමාත්‍යාංශය,
ගොවිජන මන්දිරය,
80/5, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**2001 වාර්ෂික වාර්තාව හා විගණනය කරන ලද ගිණුම්**

1971 අංක 38 දරණ මුදල් පණතේ 14 (2) වගන්තිය පරිදි 2001 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා මෙම ආයතනය සම්බන්ධයෙන් පහත සඳහන් ලේඛන ආයතනයේ පාලක මණ්ඩලය වෙනුවෙන් මේ සමඟ ඉදිරිපත් කරමි.

(1) වාර්ෂික වාර්තාව
(2) විගණනය කරන ලද ආදායම් හා වියදම් ගිණුම
(3) විගණනය කරන ලද ශේෂ පත්‍රය
(4) ගිණුම් පිළිබඳ විගණකාධිපති නිරීක්ෂණය

මෙයට, විශ්වාසී,

ඩික්ෂන් නිලවීර,
සභාපති,
පාලක මණ්ඩලය.

# වාර්ෂික වාර්තාව - 2001

## සමුදයාර්ථය

1972 අංක 5 දරණ ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන පනත යටතේ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය 1972 දී ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස ස්ථාපනය කරන ලදී. ආරම්භයේදී එ.ජා.ස.වැ/ආ.කෘ.ස. ආධාර කළ මෙම ආයතනය වත්මනේදී කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙයි. මෙම ආයතනය ආරම්භයේ සිටම සමාජ විද්‍යා පර්යේෂණ ආයතනයක් ලෙසත් ගොවි කටයුතු ප්‍රශ්න විශ්ලේෂණය කරන හා ග්‍රාම සංවර්ධනය සඳහා මානව සම්පත් පුහුණු කරන සම්පත් මධ්‍යස්ථානයක් ලෙසත් කටයුතු කරයි.

කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයා නිල බලයෙන් සභාපතිත්වය දරන පාලක මණ්ඩලයක් මඟින් ආයතනයේ පරිපාලන කටයුතු සිදු කෙරේ. මෙරටේ ගොවි කටයුතු ක්ෂේත්‍රයෙහි සංවර්ධනය සඳහා දායක වන මූලික රාජ්‍ය ආයතනවල නියෝජිතයන්ගෙන් පාලක මණ්ඩලය සමන්විත වේ. ආයතනයේ ප්‍රධානියා ලෙස කටයුතු කරන අධ්‍යක්ෂවරයා ද පාලක මණ්ඩල සාමාජිකයෙකු වෙයි.

ආයතනයට පැවරී ඇති බලතල අනුව අරමුණු බහුවිධ වන්නේය. මෙරටේ ප්‍රධානතම පර්යේෂණ ආයතනයක් ලෙස මෙම ආයතනයෙන් බලාපොරොත්තු වන්නේ ජාතික හා අන්තර් ජාතික ආයතන මඟින් ලබා ගන්නා ගොවිකටයුතු පර්යේෂණ පෝෂණය කිරීම, ආධාර කිරීම, දිරි ගැන්වීම සහ සහයෝගීතාවය පැවැත්වීමයි. මෙරටේ ගොවිජන ප්‍රජාවට අවසානයේ දී යම් සුභසාධනයක් ඇති වන ආකාරයට ආයතනය මඟින්ම පර්යේෂණ අධ්‍යයන පැවැත්වීමත් සුළු ගොවි අංශයට සම්බන්ධිත සමාජ ආර්ථික අංශ, ගොවිකටයුතු ගැටලු හා ප්‍රශ්න විමර්ශනය කිරීම මඟින් ප්‍රතිපත්ති නිර්දේශ ඉදිරිපත් කිරීමත් ආයතනයෙන් අපේක්ෂා කෙරේ. උසස් මට්ටමේ කලාපීය ගොවි කටයුතු මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව හා ආසියානු රටවල්වල සහයෝගය වර්ධනය කරමින් ගොවි කටයුතු ප්‍රශ්නවලට අදාළ පර්යේෂණ පැවැත්වීම හා තොරතුරු විසුරුවා හැරීම ද මෙහි කාර්ය භාරයක් වන්නේය. විවිධ සංවර්ධන ගැටලු අරභයා ජාතික හා කලාපීය ආයතන හා ඒජන්සි විසින් සිදු කරන පර්යේෂණ කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ ජාතික කලාපීය හා අන්තර් ජාතික සම්මන්ත්‍රණ වැඩමුළු පැවැත්වීම හා ජාතික කලාපීය පුහුණු වැඩසටහන් පැවැත්වීම ආදිය ද මෙම ආයතනයේ සංවර්ධන අරමුණුවලට අයත් වේ.

ලැබී ඇති බලතල වරප්‍රසාද අනුව ගොවිකටයුතු ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා පුහුණු වැඩසටහන් පවත්වනු ලබයි. පර්යේෂණවල හා ප්‍රතිපත්ති විශ්ලේෂණයට භාජනය විය යුතු සමාජ ආර්ථික ගොවි කටයුතු ප්‍රශ්න සංකීර්ණ ස්වභාවයෙන් යුතු නිසාත්, මෙබඳු කාර්යයන්හි නියුතු වෙනත් ආයතනයන් හි කටයුතුවලට සම්බන්ධ නිසාත් පහත සඳහන් නිර්ණායකයන් අනුව පර්යේෂණ ක්ෂේත්‍ර හඳුනා ගැනීමේ ප්‍රතිපත්තියක් ආයතනය විසින් අනුගමනය කරනු ලැබේ.

1. ගොවිකටයුතු ක්ෂේත්‍රයේ පවතින අවශ්‍යතා පර්යේෂණ කාර්ය මණ්ඩලය මඟින්ම සොයා බලා පර්යේෂණ හා පුහුණු කිරීම් කළයුතු විෂය පථයන් තීරණය කිරීම.

2. ජනාධිපති ලේකම් කාර්යාලය, කෘෂිකර්ම හා පශුසම්පත් අමාත්‍යාංශය සහ කාන්තා කාර්යාංශය, ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව, සෙසු රාජ්‍ය ආයතන මඟින් කෙරෙන ඉල්ලීම් අනුව, පර්යේෂණ අධ්‍යයන, සමීක්ෂණ, වැඩමුළු ආයතනය මඟින්ම හෝ ඔවුන්ගේ සහභාගිත්වය ඇතිව පැවැත්වීම.

3. ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, ආහාර හා කෘෂිකර්ම සංවිධානය හා සර්ඩැප් වැනි ජාත්‍යාන්තර ආයතනයන්හි ඉල්ලීම අනුව ඔවුන්ගේ ප්‍රතිපත්ති සැකසීම සඳහා පර්යේෂණ අවශ්‍යතා ඉටුකිරීම.

4. ජාතික හා අන්තර්ජාතික ආයතනයන් හි පර්යේෂණ සහ පුහුණු කිරීම් කටයුතු ඉටුකර ගැනීමට මුද්‍රිත මාධ්‍ය මගින් ඉල්ලුම් පත් කැඳවීම් ප්‍රසිද්ධ කොට ඇති විට මෙම ආයතනය මගින් ඒ සඳහා යෝජනා ඉදිරිපත් කර ක්‍රියාත්මක කිරීම.

මෙම පැවරුම අනුව ලැබී ඇති පාඨුල මහ පෙන්වීම අනුව ආයතනය මගින් ජනාධිපති ලේකම් කාර්යාලය, කෘෂිකර්ම හා පශු සම්පත් අමාත්‍යාංශය හා මුදල් අමාත්‍යාංශය ආදී රේඛීය රාජ්‍ය ආයතන සඳහා ක්ෂණික පර්යේෂණ අධ්‍යයන / සමීක්ෂණ පවත්වා ප්‍රතිපත්ති යෝජනා එම ආයතනවලට ඉදිරිපත් කරනු ලබයි. එහෙයින් ප්‍රතිපත්ති සම්පාදකයන්ට හා ගොවි ප්‍රජාවට ප්‍රයෝජනවත් පර්යේෂණයන්ට උපකාර වෙමින් පර්යේෂණ පවත්වමින් ගොවිකටයුතු ක්ෂේත්‍රයෙහි සංවර්ධනයට සාධනීය දායකත්වයක් ලබා දේ.

මෙම වාර්තාවේ විස්තරාත්මකව සඳහන් වන අයුරින්, (1) කෘෂිකර්ම සැළසුම් හා අගැයීම් (2) කෘෂි සම්පත් කළමනාකරණ (3) අලෙවි හා ආහාර ප්‍රතිපත්ති (4) වාරි ජල කළමනාකරණ හා ගොවි ජන සම්බන්ධතා (5) සංඛ්‍යාන හා දත්ත සැකසුම් (6) මානව සම්පත් හා ආයතනික සංවර්ධන යන අංශ හය මගින් ආයතනයට පැවරුණු පර්යේෂණ හා පුහුණු කිරීම් පවත්වාගෙන යනු ලැබේ. ආයතනය සතු සීමිත මූල්‍ය හා මානව සම්පත් අනුව පෙර වර්ෂවලදී මෙන්ම වසර 2001 දී ද විවිධ ගොවිකටයුතු ප්‍රශ්න සම්බන්ධයෙන් පර්යේෂණ රාශියක් සිදු කර තිබේ. මෙරටේ ගොවි ප්‍රජාවගේ අභිවෘද්ධියට හේතුවන සොයාගැනීම් හා ප්‍රතිපත්ති නිර්දේශයන් රාශියක් ඉදිරිපත් කිරීමට මෙම පර්යේෂණ මගින් හැකිවී ඇත.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන / ආ.කෘ.ස. සර්ඩැප් අන්තර් ජාතික වාරි හා ජලකළමනාකරණ ආයතනය වැනි අන්තර් ජාතික හා කලාපීය සංවර්ධන සංවිධාන සමඟ සබඳතා ගොඩනගා ගනිමින් ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කිරීමට ද ආයතනයට හැකියාව ලැබිණි. ආසියා හා පැසිපික් කලාපීය ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන මධ්‍යස්ථානයේ (සර්ඩැප්) මූල්‍ය ආධාර ලබා මාතලේ, මහනුවර හා අනුරාධපුර දිස්ත්‍රික්කවල කාර්යබද්ධ පර්යේෂණ පැවැත්වීම එබඳු ඒකාබද්ධ වැඩසටහන් පිළිබඳව මනා නිදසුනක් වේ.

## පර්යේෂණ හා පුහුණු කිරීම් පිළිබඳ වැදගත් කරුණු

පෙර වසරවලදී මෙන්ම 2001 දී ද ආයතනය මගින් විවිධ වැදගත් පර්යේෂණ හා පුහුණු කිරීම් කටයුතු මාලාවක් ගොවි කටයුතු ක්ෂේත්‍රය අරභයා පවත්වාගෙන යන ලදී. ප්‍රතිපත්ති සම්පාදකයන්ට හා ගොවි ප්‍රජාවට යන දෙඅංශයටම වැඩදායී එබඳු කටයුතු කිහිපයක් පහත සඳහන් කරණු ලැබේ.

ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව විසින් ආයතනයට භාරදෙන ලද වැදගත් අධ්‍යයනයක් කෘෂිකාර්මික ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීමේ අංශය මගින් නිමකරන ලදී. " සමාජ ආර්ථික මූලික සමීක්ෂණය " නම් මෙම වාර්තාව 2001 මාර්තු මාසයේදී ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව වෙත භාරදෙන ලදී. ලෝක බැංකුව අරමුදල් සපයන ලද ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීම හා සම්බන්ධිත සේවා ව්‍යාපෘතියෙහි මහනුවර දිස්තික්කයේ උඩපලාත, ගම්පහ දිස්තික්ක්යේ දිවුලපිටිය, රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ යන ප්‍රදේශවල පවතින නියමු ව්‍යාපෘතියෙහි ප්‍රතිලාභීන්ගේ මූලික සමාජ ආර්ථික දත්ත මෙම වාර්තාවට ඇතුළත් විය. එහි අඩංගු කෙටි කාලීන හා දිගු කාලීන නිර්දේශයන්, ඉඩම් හිමිකම් ව්‍යාපෘතිය ප්‍රතිසංවිධානය කිරීමට ප්‍රතිපත්ති සම්පාදකයන්ට ප්‍රයෝජනවත් වනු ඇත.

මෙම අංශය මගින් සිදුකරන ලද තවත් වැදගත් අධ්‍යයනයක් වූයේ ඒකාබද්ධ " ජනපද ක්‍රමවල සම්පත් භාවිතා කරන ආකාරය පිළිබඳ ඉඩම් ප්‍රමාණයේ වැදගත්කම " යන පර්යේෂණ වාර්තාවයි. සුළු ගොවියන් සම්පත් භාවිතා කරන ආකාරය විමසීම මෙම අධ්‍යයනයේ දී මූලික වශයෙන් ප්‍රයන්ත දරා ඇත. ජනපදකරණය පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදකයන්ට, ක්‍රියාත්මක කරන ආයතනවලට හා සැලසුම්කරුවන්ට මෙහි සොයා ගැනීම් වැදගත් වනු ඇත.

වාරි ජල කළමනාකරණ සහ ගොවිජන සබඳතා අංශය ද, වර්ෂය මුලදීම " කෘෂි ළිංවල සාර්ථකභාවය මැන බැලීම " නම් පර්යේෂණයක් අවසන් කළේය. මෙය සිදුකරන ලද්දේ කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි ය. මාවතවැව හා ගලේවෙල ප්‍රදේශවල තෝරාගත් කෘෂි ළිංවල ක්‍රියාකාරීත්වය පිළිබඳ තොරතුරු ආවරණය කරමින් මෙම අධ්‍යයනයේ සොයා ගැනීම් සිදු කර ඇත.

භෝග නිෂ්පාදනය සඳහා ජල භාවිතය, ජල නිෂ්පාදනයෙහි උච්ඡාවචනය හා අධ්‍යයන ප්‍රදේශවල කෘෂි ලිං මඟින් ආහාර නිෂ්පාදනයෙන් ආදායම් උත්පාදනය පිළිබඳ තොරතුරු මෙයට ඇතුළත් වේ.

අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය අපනයන සංවර්ධන මණ්ඩලයේ ඉල්ලීම අනුව මැංගුස්ටීන් නිෂ්පාදනය පිළිබඳ වැදගත් අධ්‍යනයක් නිම කළේය. 2001 අප්‍රේල් මාසයේදී නිම කළ මෙම අධ්‍යනයෙන් මැංගුස්ටීන් නිෂ්පාදනය, අලෙවිය හා ඒ පිළිබඳ ප්‍රතිපත්ති නිර්දේශයන්ට අයත් තොරතුරු අඩංගු වේ. එම අංශය පෙර වසරවලදී මෙන්ම ජාතික ආහාර සුරක්ෂිත කමිටුවට අලෙවි තොරතුරු සැපයීමෙන් සැලකියයුතු සේවාවක් ඉටු කළේය. ඒ සමඟම එහි සතිපතා හා මාසික ආහාර විවරණිකා මඟින් ප්‍රතිපත්ති සම්පාදකයන්ට, වෙළෙඳුන්ට හා ගොවීන්ට අලෙවි තොරතුරු ලබාදීමෙන් වැදගත් සේවයක් ඉටු කළේය.

ආචාර්ය ඇස්.ඡ්. සමරසිංහ,
අධ්‍යක්ෂ,
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු
පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය,
කොළඹ 07.

2001 මාර්තු 30.

# පාලක මණ්ඩලය (වසර තුළදී සිදුවූ වෙනස්කම්)

පහත සඳහන් පාලක මණ්ඩල සංයුතියේ වෙනස්කම් වර්ෂය තුළදී සිදු විය.

කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් ධූරයෙන් ඉවත්වීමත් සමඟම එම්.එස්. වික්‍රමාරච්චි මහතාගේ පාලක මණ්ඩල සභාපති ධූරය අහෝසි විය (2001-10-14 දින සිට).

ආනන්ද එස්. ගුණසේකර මහතා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් ධූරයට පත්වීමත් සමඟම පාලක මණ්ඩලයේ සභාපති ධූරයට පත්විය (2001-15-10).

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨය නියෝජනය කරමින් මහාචාර්ය ඊ.ආර්.එන්. ගුණවර්ධන මහතා පාලක මණ්ඩලයට පත්විය (2001-02-15 සිට).

සේවා කාලය අවසන් වීම නිසා එම්.බී. ඒකනායක මහත්මියගේ සාමාජික ධූරය අහෝසි විය (2001-06-01).

## කාර්ය මණ්ඩලය සංවර්ධනය

### පශ්චාත් උපාධි වැඩ සටහන

පහත සඳහන් පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරීහු පශ්චාත් උපාධි අධ්‍යයනයෙහි යෙදී සිටියහ.

| | | |
|---|---|---|
| එම්.එස්. ගෞර් ශංකර් මහතා, පර්යේෂණ නිලධාරි | - | ජපානයේ කෝබේ විශ්ව විද්‍යාලයේ කෘෂි ආර්ථික විද්‍යා ආචාර්ය උපාධි පාඨමාලාව හැදෑරීම. |
| ඩබ්.ඩී. වික්‍රමසිංහ මිය, පර්යේෂණ නිලධාරිණී | - | ජර්මනියේ ග්ලිසින් විශ්ව විද්‍යාලයේ කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධි පාඨමාලාව හැදෑරීම. |
| පී.ඩී.ජේ. ආනන්ද මහතා, පර්යේෂණ නිලධාරි | - | ඕස්ට්‍රේලියාවේ ට්‍රෝබෝන් විශ්වවිද්‍යාලයේ කෘෂිකාර්මික සහ සම්පත් ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධි පාඨමාලාව හැදෑරීම. |
| ටී.ඒ. ධර්මරත්න මහතා, පර්යේෂණ නිලධාරි | - | චීනයේ හුවාසොං විශ්වවිද්‍යාලයේ සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධි පාඨමාලාව හැදෑරීම. |

### 2001 දී සහභාගි වූ සම්මන්ත්‍රණ, වැඩමුළු හා පුහුණු වැඩසටහන්

අධ්‍යක්ෂ ආචාර්ය ඇස්.ඒ. සමරසිංහ මහතා අගෝස්තු 07 සිට 09 දක්වා බංග්ලාදේශයේ ඩකා නුවර පැවති සර්ඩැප් තාක්ෂණික කමිටු රැස්වීමට සහභාගි වීම.

වාරි ජල පාලන හා ගොවිජන සම්බන්ධතා අංශයේ ප්‍රධාන ආර්. ද එස්. ආර්යබන්දු හා ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි එම්.එම්.එම්. අහියර් යන මහත්වරු සැප්තැම්බර් 10 සිට 14 දක්වා ජර්මනියේ පැවැති 10 වැනි අන්තර් ජාතික වැසිදිය එකතු කිරීමේ පද්ධති සමුළුවට සහභාගි වූහ.

අධි පර්යේෂක එල්.පී. රූපසේන මහතා දෙසැම්බර් 05 සිට 07 දක්වා පිලිපීනයේ පැවැති පශ්චාත් අස්වැන්න පිළිබඳ ආසියා - පැසිපික් කලාපීය උපදේශක වැඩ මුළුවට සහභාගි වීම.

## කාර්ය මණ්ඩල තත්ත්වය

වසර තුළදී ආයතනයේ කාර්ය මණ්ඩලයේ තත්ත්වය පහත සඳහන් වේ.

| කාර්ය මණ්ඩලය | 2000.12.31 දිනට තත්ත්වය | වසර තුළදී නතර කිරීම ඉල්ලා අස්වීම් | පත්කිරීම් | 2001.12.31 දිනට තත්ත්වය |
|---|---|---|---|---|
| අධ්‍යක්ෂ | 01 | - | - | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) | 01 | 01 | 01 | 01 |
| අංශ ප්‍රධානීන් | 06 | - | - | 06 |
| පර්යේෂණ කාර්ය මණ්ඩලය | 20 | - | - | 20 |
| පරිපාලන කාර්ය මණ්ඩලය | 06 | - | 01 | 06 |
| පුස්තකාලයේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | 02 | - | - | 02 |
| දත්ත සංවර්ධන ඒකකයේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | 02 | - | - | 02 |
| පරිගණක ඒකකය | 01 | - | - | 01 |
| ප්‍රකාශන ඒකකයේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | 04 | - | - | 04 |
| සංඛ්‍යාන කාර්ය මණ්ඩලය | 22 | 01 | - | 21 |
| තාක්ෂණික කාර්ය මණ්ඩලය | 03 | - | - | 03 |
| ලිපිකාර, ලේකම් හා සමාන්තර ශ්‍රේණි | 48 | 01 | - | 47 |
| මෙහෙයුම් හා සම්බන්ධිත ශ්‍රේණි | 36 | - | - | 36 |
| **එකතුව** | **152** | **04** | **02** | **150** |

## කෘෂිකාර්මික ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශය

### කාර්ය මණ්ඩලය

| | | |
|---|---|---|
| ජ්.එම්. හේනෙගෙදර මහතා | - | අංශ ප්‍රධාන |
| ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතා | - | අධි පර්යේෂක |
| එස්.ආර්. බණ්ඩාර මහත්මිය | - | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිණී |
| ආර්.එල්.එන්. ජයතිස්ස මහතා | - | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී |
| එන්.එන්.ඒ. ද සිල්වා මහතා | - | ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාන නිලධාරී |
| එස්. සේනානායක මහත්මිය | - | සංඛ්‍යාන නිලධාරිණී |
| එම්.එස්. ගෞරී ශංකර් මහතා | - | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී (අධ්‍යයන නිවාඩු) |

## නිමකළ අධ්‍යයන

### 1. ඉඩම් හිමිකම් සම්බන්ධිත සේවා ව්‍යාපෘතියේ මූලික සමාජ ආර්ථික සමීක්ෂණය

පර්යේෂකයෝ :

| | | |
|---|---|---|
| ආචාර්ය ඩබ්.ජ්. ජයසේන | - | (අධ්‍යයන සම්බන්ධීකාරක සහ ප්‍රධාන පර්යේෂක) |
| එම්. හේනෙගෙදර මහතා | - | (සහාය පර්යේෂක) |
| ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතා | - | (සහාය පර්යේෂක) |
| එම්.එස්. සේනානායක මහතා | - | (සහාය පර්යේෂක) |
| ආර්.එල්.එන්. ජයතිස්ස මහතා | - | (සහාය පර්යේෂක) |

අධ්‍යයන ප්‍රදේශ : දිවුලපිටිය, ගම්පොළ, උඩපලාත සහ බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

ඉඩම් පරිහරණ දෙපාර්තමේන්තුව මගින් මෙම අධ්‍යයනය කිරීමට ආයතනයට ආරාධනා කරන ලදී. අධ්‍යයනයේ අපේක්ෂිත අරමුණු පහත සඳහන් වේ.

i. සමාන්තර සමාජ හා ආර්ථික විශ්ලේෂණයන් මගින් ව්‍යාපෘති ප්‍රදේශ තුළෙහි ගම්වාසීන් (ව්‍යාපෘති ප්‍රතිලාභීන්) ගේ ව්‍යාපෘතියට පෙර සමාජ ආර්ථික තත්ත්වයන් පිළිබඳව දත්ත පදනමක් නිර්දේශ කිරීම.

ii. සමාන්තර ඇගයීම් අධ්‍යයනයන් සඳහා පවතින ඉඩම් පරිහරණ රටාවන්, ඉඩම් හිමිකම හා භුක්ති ක්‍රම පිළිබඳව ගම්මට්ටමේ දත්ත එකතු කර වාර්තා ගත කිරීම.

iii. ව්‍යාපෘතියේ සමාජ හා ආර්ථික බලපෑම්වල සාධනීය හා නිෂේධනීය අංග හඳුනා ගැනීම.

iv. නියමු ව්‍යාපෘතිය පිළිබඳව මහජනතාව හා එහි ඉඩම් හිමිකරුවන් දැනුවත් කරමින් ඔවුන් ව්‍යාපෘතිය සඳහා සූදානම් කරනු පිණිස පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික තත්ත්වය හා ඉඩම් කළමනාකරණය පිළිබඳ සාධනීය තොරතුරු සැපයීම.

v. ඉඩම් හිමිකම් ව්‍යාපෘතිය පූර්ණ ලෙස ක්‍රියාත්මක වූ විට සිදු වෙන වැදගත් වෙනස්වීම් සක්සුදක්සේ පැහැදිලිවන විට නියමු හා පාලිත ප්‍රදේශවල ප්‍රති සමීක්ෂණයන් කිරීම සඳහා පදනම් සැකසීම.

vi. ඉඩම් හිමිකම් ව්‍යාපෘතිය රට මුළුල්ලේම ක්‍රියාත්මක කිරීම සඳහා ආදර්ශනයක් සම්පාදනය කිරීම.

vii. සමීක්ෂණයේ සොයාගැනීම් අනුව ව්‍යාපෘතිය සැකසීමේ කටයුතු වෙනස් කිරීම හා වර්ධනය කිරීම සඳහා නිර්දේශයන් කිරීම.

## ප්‍රතිපත්ති නිර්දේශ

අදාළ ප්‍රදේශවල ජනතාවගේ ඉඩම් අයිතිය හා භුක්ති ක්‍රමය මෙන්ම ඉඩම් සම්පතෙහි ආර්ථික කටයුතු තහවුරු වන නිසා ඉඩම් හිමිකම් වැඩසටහන ඉතා ප්‍රයෝජනවත් එකක් ලෙස අධ්‍යයන ප්‍රදේශ තුනෙහි ජනතාව සිතන බව සමීක්ෂණයෙන් අනාවරණය විය. කෙසේ වුවද, මෙම ප්‍රදේශවල මෙම වැඩසටහන සාර්ථකව පවත්වාගෙන යාමට නම් ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් ඔවුන්ගේ සමාජ ආර්ථික අංග ලක්ෂණ, පවතින ඉඩම් හිමිකම හා භුක්ති ක්‍රමවල බාධක / අර්බුද පිළිබඳව ක්‍රියාත්මක කිරීමේ ආයතන තුළ මනා දැනීමක් තිබිය යුතුය. මේ අංග පිළිබඳ තොරතුරු විශාල ප්‍රමාණයක් මෙම සමීක්ෂණ වාර්තාවේ අඩංගු වී ඇති අතර එම තොරතුරු, මෙම ප්‍රදේශවල පවතින සමාජ ආර්ථික තත්ත්වය අවබෝධ කර ගැනීමට ප්‍රතිපත්ති සම්පාදකයන්ට අතිශයින් ප්‍රයෝජනවත් වනු ඇත.

මෙම කොටසේ දී අප විසින් කරනු ලබන ප්‍රතිපත්ති නිර්දේශයන් මෙම ප්‍රදේශවල ව්‍යාපෘතිය සම්බන්ධ කටයුතු සාර්ථකව ඉටුකර ගැනීමටත් යෝජිත වැඩසටහනට අවශ්‍ය ගැලපීම් කිරීමටත් ප්‍රතිපත්ති සම්පාදකයන්ට ප්‍රයෝජනවත් වනු ඇත.

1. ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳව ප්‍රතිලාභීන් ඇල්මක් පෙන්නුවත් ඔවුන් ලබාගෙන ඇති දැනුම ප්‍රමාණවත් නොවේ. මෙම ව්‍යාපෘතිය පිළිබඳව අපැහැදිලි ප්‍රශ්න හා සැකයක් ඔවුන් තුළ පවතී. එනිසා ව්‍යාපෘතිය මගින් යෝජිත ක්‍රියාත්මක වන වැඩ කටයුතු පිළිබඳව ඔවුන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා පියවර ගත යුතු අතර ව්‍යාපෘතිය බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීම සඳහා එය ඉතා ප්‍රයෝජනවත් වනු ඇත.

2. සමීක්ෂණයෙන් සොයාගත් කරුණු අනුව මෙම ප්‍රදේශවල ඉඩම් කොටස් සැහෙන සංඛ්‍යාවක් නොවිසඳුන භුක්ති ක්‍රම යටතේ දැනට පවතී. එනිසා මෙම ව්‍යාපෘතියෙහි ඇති ඉඩම් ලියාපදිංචි කිරීමේ ඉලක්ක කරා ළඟාවීම සඳහා මෙම නොවිසඳුන භුක්ති ක්‍රම පිළිබඳ ප්‍රශ්න සාර්ථක ලෙස විසඳීම අත්‍යාවශ්‍ය වේ.

3. මෙම නොවිසඳුන භුක්ති ක්‍රම පිළිබඳව වගකිවයුතු ආයතන වන්නේ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව මෙම ප්‍රදේශ තුන ආසන්නයෙහි පිහිටා ඇති පෞද්ගලික හා රාජ්‍ය සමාගම් හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම වේ. එම ඉඩම් නීත්‍යානුකූල කිරීම, හිමිකම පිළිබඳව දැනට පවතින ප්‍රශ්න/අර්බුද විසඳීම හා විශේෂයෙන් එම ආයතන විසින් බෙදා වෙන් කළ ඉඩම් ඒකකවල භුක්තිය පිළිබඳ ප්‍රශ්න යන කරුණු විසඳීම සඳහා අදාළ ආයතනවලින් ආධාර ලබාගත යුතුය.

4. පක්ෂපාතිත්වය මත සිදුවේ යැයි යන මතය නිසා එම ප්‍රදේශවල ප්‍රතිලාභීහු යෝජිත තීරණ ක්‍රියාවලිය පිළිබඳව සතුටු නොවෙති. එනිසා යෝජිත තීරණයන් නීතිමය පදනමක් සපයා ශක්තිමත් කිරීම අත්‍යාවශ්‍ය වේ. මෙම ප්‍රදේශවල නීතිමය පදනමක් මත ක්‍රියාත්මක වන සමථ මණ්ඩලය නීතිමය සංස්ථාවක් ලෙස බොහෝ ජනතාව පිළිගනිති. යෝජිත තීරණ මණ්ඩල සමඟ එක්ව ඉඩම් භුක්ති ක්‍රමවල අයිතිය පිළිබඳව තීන්දු ගැනීමට සමථ මණ්ඩලවල ආධාර පැතිය යුතුය. ජනතාවගේ විශ්වාසය දිනාගැනීමටත්, ඉඩම් අයිතිය හා භුක්ති ක්‍රමවල අර්බුද සම්බන්ධයෙන් ගන්නා තීරණ ජනතාවගේ පිළිගැනීමට ලක්වීමට ද පහත සඳහන් ක්‍රමය ඵලදායක වේ.

5. ඉඩම් බලයෙන් අල්ලාගත්ත වුන්ගේ හා රබර් වතුවල (සිංහල හා දෙමළ දෙවර්ගයේම) කම්කරුවන්, වගාව හෝ පදිංචිය සඳහා රජයේ අවසර නැතිව ඉල්ලා ගත්තවුන් වැනි ඉඩම් හිමියන් විශාල සංඛ්‍යාක් ඇත. මෙම ඉඩම් තවමත් නීතිගත නොකළ හෝ නොවිසඳුන තත්ත්වයේ පවතී. මෙම ව්‍යාපෘතියේ ඉලක්ක සපුරා ගැනීමට නම්, මෙම පුද්ගලයන් වරප්‍රසාදයෙහි තත්ත්වයේ සිටින්නන් ලෙස සලකා ඔවුන්ගේ ප්‍රශ්න විසඳිය යුතුය.

6. නීතිමය වශයෙන් කිසිදු ලියවිල්ලක් නොමැතිව දීර්ඝ කාලයක් බාධාවකින් තොරව ඉඩම්වල සියළු අයිතීන් භුක්ති විඳින ඉඩම් හිමියන් සැළකිය යුතු පිරිසක් වේ. තීරක මණ්ඩල මගින් මෙම ප්‍රශ්නය විසඳීම සඳහා පියවර ගත යුතුය.

7. අපගේ නිරීක්ෂණයන් හා අදාළ නිලධාරීන්ගේ වාර්තා අනුව රජයේ අරමුදල් මගින් ආරම්භ කරන ලද හිමිකම් සහතික වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේ වගකීම දරණ ආයතන අතර සම්බන්ධීකරණය දුර්වල බව පෙනී යයි. එමනිසා ව්‍යාපෘතියේ නියම කරන ලද කටයුතු ක්‍රියාත්මක කිරීමේ ආයතන අතර සම්බන්ධීකරණ තවදුරටත් වර්ධනය කළ යුතුය.

8. ඉඩම් පිඹුරුපත් සකස්කිරීම හා වර්තමාන ඉඩම් රෙගුලාසි නීති විරෝධීව අත්පත් කරගැනීම, ඉඩම් කට්ටි පිහිටි ස්ථාන හඳුනාගැනීම වැනි කටයුතු සඳහා ඉඩම් කළමනාකරණය හා භුක්ති ක්‍රම පිළිබඳ මනා දැනීමක් ඇති අදාළ දිසා ලේකම් කාර්යාලවල සේවයේ නියුතු ප්‍රධාන නිලධාරීන්ගේ සහාය ලබාගැනීම අත්‍යාවශ්‍ය වේ. ඉඩම් පිඹුරුපත් සැකසීමේදී ඇතිවිය හැකි වැරදි හා දෝෂ අවම කර ගැනීමට මෙය හේතුවනු ඇත.

9. නිල මාර්ගයකින් හෝ (චක්‍රලේඛයක් වැනි) නීත්‍යානුකූල ආකාරයකින් නොදැන්වූ නිසා රජයේ මෙහෙයුමෙන් සිදු කෙරෙන ඉඩම් ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතියෙන් නිකුත් කරන ඔප්පු පිළිගැනීමට ඒවා උගසට ගෙන ණය දීමට හෝ බැංකු මැලිකමක් දක්වන බව සමීක්ෂණයෙන් අනාවරණය විය. නව ක්‍රමයෙන් " සොයා ගැනීමේ ක්‍රියාවලිය " පිළිබඳව අවශ්‍ය උපදෙස් ලබාදිය යුතුය.

## දීර්ඝ කාලීන නිර්දේශ

1. මෙම ව්‍යාපෘතියේ පුළුල් සංවර්ධන අරමුණු වන්නේ ක්‍රියාශීලී ඉඩම් පරිහරණ හා කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දීම තුළින් ජනතාවගේ සමාජ ආර්ථික තත්ත්වයන් දියුණු කිරීමය. කෙසේ වුවද පිරිසිදු ඉඩම් ඔප්පුවක් නිකුත් කිරීම හා භුක්ති ක්‍රමවල අර්බුද විසඳීමෙන් පමණක් මෙම පුළුල් අරමුණ ඉටුකර ගත නොහැකිය. මක්නිසාදයත් රටෙහි ඉඩම් සම්පත් ඵලදායක ලෙස උපයෝගී කර ගැනීමට කෘෂි දේශගුණය, පිහිටි ස්ථානය, ඉඩමේ තත්ත්වය, ආයතනික කරුණු, මිල, වෙළෙඳාම, අලෙවිය වැනි සාර්ව ආර්ථික ප්‍රතිපත්ති වැනි අංග රාශියක් හේතුවන බැවිනි. මේ නිසා ව්‍යාපෘතියේ සංවර්ධන අරමුණ ඉටුකර ගැනීම සඳහා ඒකාබද්ධ ප්‍රවේශයක් අවශ්‍ය වේ.

2. භුක්ති ක්‍රමය ආරක්ෂාව ස්ථාපිත කිරීම තුළින් ඉඩම් වෙළෙඳපොළ දියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ වැදගත් දීර්ඝ කාලීන අරමුණක් වේ. කෙසේ වුවද ඒ සඳහා පවතින ඉඩම් සම්බන්ධ සීමා කිරීම් ඉවත් කිරීම අවශ්‍ය වේ. එබඳු සීමා කිරීම් ඉවත් කිරීම තවමත් සිදු වී නොමැති බව සමීක්ෂණයෙන් අනාවරණය විය. එහෙයින් මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා පවතින ඉඩම් සම්බන්ධිත සීමා කිරීම ඉවත් කිරීමට දිරිගැන්විය යුතුය.

## කෙරෙමින් පවතින පර්යේෂණ

1. සුළු ගොවි අංශය සඳහා ග්‍රාමීය ණය : ජයග්‍රහණයන් අසාර්ථකවීම හා අනාගත හැකියාවන්
පර්යේෂක : ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතා

**අධ්‍යයන ප්‍රදේශ**

රාජාංගන ප්‍රධාන වාරි මාර්ග යෝජනා ක්‍රමයේ, යාය 5 හා 12 සහ කැකිරාව ගොවිජන කේන්ද්‍ර බල ප්‍රදේශයේ මැද වැව, අලියා වැටුණ වැව හා කළුඑබ්බ සහ සුළුවාරි යෝජනා ක්‍රමවලට අයත් ගම් මෙහි අධ්‍යයන ප්‍රදේශ වේ.

**විෂය පරිපථය හා අරමුණු**

මීට පෙර බැංකු විසින් ක්‍රියාත්මක කරන ලද ණය යෝජනා ක්‍රමවලින් ඇතිවූ ප්‍රශ්න විසඳීම සඳහාත්, (ගොවීන් ඇතුළු) ජනතාවගේ ණය අවශ්‍යතා සපුරාලීමටත් 1980 ගණන්වල සිට රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන ආයතන හා ප්‍රජා සංවිධාන මගින් සහභාගිත්ව ක්ෂුද්‍ර ණය යෝජනා ක්‍රම ක්‍රියාවට නංවන ලදී. මෙම අධ්‍යයනයේ අරමුණු වන්නේ පෙර පැවති ණය යෝජනා ක්‍රමවල ඇති වූ ප්‍රශ්න විසඳීමේදී සහභාගිත්ව ක්ෂුද්‍ර ණය යෝජනා ක්‍රමවල සාර්ථකත්වය විමසා බැලීමයි.

**අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ**

i. අතීතයේ සුළු පරිමාණ ගොවීන්ගේ ණය අවශ්‍යතා සපුරාලීමේදී, රජයේ ආයතනවල ණය යෝජනා ක්‍රමවල සාර්ථකත්වයේ මට්ටම හා අසාර්ථක වීමට හේතු විමසීම.

ii. ආයතනික ණය පද්ධති යටතේ මුහුණපාන ලද අර්බුද මග හරිමින් සුළු ගොවියන්ගේ ණය අවශ්‍යතා සපුරාලීම සඳහා සහභාගිත්ව ක්ෂුද්‍ර ණය යෝජනා ක්‍රමවල හැකියා ඇගයීම.

පහත වන්නේ අධ්‍යයනයේ නියත අරමුණය :

i. සුළුගොවි ජනතාවගේ ණය අවශ්‍යතා ඔවුන්ට ලබා ගැනීමට ඇති හැකියාව, සහභාගිත්ව, ක්ෂුද්‍ර ණය හා යෝජනා ක්‍රමවලින් කොතරම් දුරට වර්ධනය වී ඇත්දැයි විමර්ශනය කිරීම හා ළඟාවීම වර්ධනය කිරීමට සහභාගිත්ව ක්ෂුද්‍ර ණය යෝජනා ක්‍රම කොතරම් දුරකට හැකිවූවාද යන්න විමසීම.

ii. මෙම ණය යෝජනා ක්‍රමවල ප්‍රතිලාභ හා ප්‍රතිරෝධක පිළිබඳව සුළුගොවියන්ගේ අවබෝධය හා ආකල්ප සොයා බැලීම.

iii. සිය කටයුතු පුළුල් කිරීමේ සහභාගිත්ව ණය යෝජනා ක්‍රම මුහුණපාන ප්‍රශ්න හඳුනාගැනීම.

iv. සුළුගොවි ණය ගැටලු පිළිබඳ සුදුසු ප්‍රතිපත්ති නිර්දේශයන් කිරීම.

**අරමුදල් සැපයෙන ආයතන**

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මගින් අරමුදල් සපයනු ලැබේ.

**ක්‍රමවේදය**

මෙම අධ්‍යයනට ක්‍රම දෙකක් ඇතුළත් වේ. පළමුවැන්න ලේඛනගත සමීක්ෂණයක් වන අතර, අධ්‍යයන ප්‍රදේශයේ ගොවීන් හා ක්ෂුද්‍ර ණය ආයතන ආවරණය කරමින් කෙරෙන ක්ෂේත්‍ර සමීක්ෂණය දෙවැන්න වේ. ලේඛනගත සමීක්ෂණය සම්පූර්ණයෙන්ම අවසන් වී ඇත. ක්ෂේත්‍ර සමීක්ෂණයේ දත්ත රැස්කිරීම ද නිම වී ඇත. දත්ත විශ්ලේෂණ කටයුතු හා වාර්තාව සම්පාදනය කිරීම එකවිට කෙරෙමින් පවතී.

ලේඛනගත සමීක්ෂණයේදී අංශ දෙකකින් පැරැණි ආයතනික ක්‍රම අසාර්ථක වූ බව පෙනී යයි. පළමුවැන්න ඉල්ලුමට අයත් වන අතර දෙවැන්න සැපයුම් අංශයට අයත් වේ. ඉල්ලුම් අංශයෙන් බලන විට ප්‍රධාන බාධකයක් වී ඇත්තේ සුළු ගොවීන්ට බැංකු මඟින් නියමකරන ආකාරයේ අය තැබීමට නොහැකිවීම, අනම්‍ය නීතිරීති හා කල්ගතවන ක්‍රියාමාර්ගය නිසා ගොවීන්ට නිසි කලට ණය ලබාගත නොහැකිවීම ආදියයි. සුළු ගොවියන්ට සුළු ප්‍රමාණයේ ණය ලබාදීමේ විශාල පරිපාලන පිරිවැයක් දැරීමට සිදුවීම, ග්‍රාමීය මට්ටමේ ණය සුපරීක්ෂා කිරීම හා අයකර ගැනීම පිළිබඳ දුර්වලතා , ඒ සඳහා සුදුසු යන්ත්‍රණයක් නොමැතිවීම හා අයහපත් ණය ආපසු ගෙවීම ආදිය සැපයුම් අංශයේ දුර්වලතා වෙයි.

ක්ෂේත්‍ර සමීක්ෂණය අනුව, වී ගොවිතැනේ නියැලෙන සුළු ගොවීහු සිය වගා කටයුතු සඳහා ණය මත යැපෙති. මෙම ණය අවශ්‍යතා සැපිරෙන්නේ අර්ධ විධිමත් හා අවිධිමත් මාර්ග වලිනි. අර්ධ විධිමත් මාර්ග ලෙස ගොවි බැංකු, ගොවි සංවිධාන, සණස, සර්වෝදය සංගමය, සමෘද්ධි බැංකුව හා වෙනත් ග්‍රාමීය මට්ටමේ සංවිධාන වැදගත් සේවයක් කරයි. මේ සියල්ල සහභාගිත්වය පදනම් කරගත් ආයතන වේ. ඉහත සඳහන් කළ ණය ක්‍රමවල දුර්වලතා මැඩගෙන සුළු ගොවීන්ගේ කෙටිකාලීන වගා ණය අවශ්‍යතා සැපිරීමට මෙම ආයතනවලට හැකියාව ඇති බව පෙන්වා දී ඇත.

## 2. ශ්‍රී ලංකාවේ සහල් නිෂ්පාදන පිරිවැයට බලපාන අංග

**පර්යේෂකයෝ :**
ජ්.එම්. හේනෙගෙදර මයා
එල්.පී. රූපසේන මයා
එම්.එම්.එම්. අහියර් මයා

වාරිමාර්ග හා වර්ෂා ජලයෙන් නිෂ්පාදන කටයුතුවල යෙදෙන ශ්‍රී ලංකාවේ වී ගොවියන් මුහුණ දෙන වර්තමාන ආර්ථික තත්ත්වයන් විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයෙන් අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකාවේ වී ගොවිතැන ප්‍රවර්ධනය කිරීම හා මෙම අංශයෙහි පැනනැගෙමින් පවතින ප්‍රවණතා සහ වර්තමාන හා ඉදිරියේදී ඇතිවිය හැකි ප්‍රශ්න මතුකරලීමේ අදහසින් මෙම අධ්‍යයනය සකස් වී ඇත. ග්‍රාමීය ප්‍රදේශවල කෘෂිකාර්මික කුටුම්භ ආර්ථිකයට බලපාන ප්‍රධාන ප්‍රශ්න විස්තරාත්මක ආකාරයට සැපයීම මෙම අධ්‍යයනයේ දී සිදුවනු ඇත.

**අරමුදල් සපයන ආයතන**

ජාතික විද්‍යා පදනම මේ සඳහා අරමුදල් සපයයි.

**අරමුණ**

ශ්‍රී ලංකාවේ වී වගා ක්ෂේත්‍රය මුහුණ පා ඇති වත්මන් සමාජ සහ ආර්ථික සාධක හඳුනා ගැනීම, යෝජිත අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ.

අනෙකුත් විශේෂිත අරමුණු වන්නේ,

i. අලෙවිකරණය ඇතුළුව සහල් නිෂ්පාදන වියදම කෙරෙහි බලපාන සාධක හඳුනා ගැනීම සහ විශ්ලේෂණය කිරීම.
ii. ශ්‍රී ලංකාවේ වියළි, අන්තර් සහ තෙත් කලාපයන් හි වාරි මාර්ග (මහ සහ සුළු වාරි මාර්ග) සහ වර්ෂා පෝෂිත තත්ත්වයන් යටතේ සහල් කි.ග්‍රෑ. 01 ක් නිෂ්පාදනය කිරීම සඳහා වන සාමාන්‍ය වියදම සහ යෙදවුම් වියදම නිශ්චය කර ගැනීම.
iii. නිෂ්පාදන වියදම් අඩුකර ගැනීමේ ක්‍රම සොයා බැලීම.

### ක්‍රමවේදය

පර්යේෂණ සැකසී ඇත්තේ දත්ත එක් රැස් කර ගැනීමේ ක්‍රම 03 ක් පදනම් කරගනිමිනි. එනම් ප්‍රාථමික, ද්විතීයික හා සහභාගිත්ව දත්ත රැස්කිරීමේ ශිල්ප ක්‍රම භාවිතා කිරීමෙනි. ප්‍රශ්නාවලි සමීක්ෂණයක් මගින් නිෂ්පාදන වියදම්, යෙදවුම්, සැපයුම, නිෂ්පාදනය හා පරිභෝජනය පිළිබඳවත්, සමාජ - ආර්ථික තොරතුරු පිළිබඳවත් වී වගාවේ ගැටලු හා සීමාවන් පිළිබඳවත් දත්ත ලබා ගැනීම සඳහා අනෙකුත් ක්‍රම වේදයන් භාවිතා කරනු ලැබීය.

### අධ්‍යයන ප්‍රදේශය

කුරුණෑගල හා කෑගල්ල දිස්ත්‍රික්කයන්ට අයත් පහත සඳහන් ප්‍රදේශ අධ්‍යයනයට ඇතුලත් ය.

| **කුරුණෑගල** | **කෑගල්ල** |
|---|---|
| නිකවැරටිය (මහා වාර්මාර්ග) | දැදිගම (වැසිදිය) |
| හෙට්ටිපොළ (කුඩා වාර්මාර්ග) | රඹුක්කන (වැසිදිය) |
| පන්නල (වැසිදිය) | |

### මූලික සොයා ගැනීම

ක්ෂේත්‍ර විමර්ශන හා සාම්පල් සමීක්ෂණයේ මූලික ප්‍රතිඵල අනුව කුරුණෑගල හා කෑගල්ල දිස්ත්‍රික්ක දෙකෙහි නිෂ්පාදන වියදම හා ප්‍රතිලාභ සම්බන්ධ වර්තමාන තත්ත්වය පහත දැක්වෙන පරිදි සම්පිණ්ඩනය කොට දැක්විය හැකිය.

### අ ). නිෂ්පාදන පිරිවැය

ගතවූ වසර දහය තුළ දිස්ත්‍රික්ක දෙකෙහිම වී නිෂ්පාදන පිරිවැය 100% න් ඉහළ ගොස් ඇත. කුරුණෑගල දිස්ත්‍රික්කයෙහි වී ගොවිතැනෙහි නිෂ්පාදන වියදම, ප්‍රධාන වාර්මාර්ග, සුළු වාර්මාර්ග හා වර්ෂා පෝෂිත යන අංශ තුනෙහි නිෂ්පාදන වියදම් එකිනෙකට වෙනස් බවද හෙළි වේ. සාපේක්ෂ වශයෙන් වර්ෂා පෝෂිත හා මහා වාර්මාර්ගවලට වඩා සුළු වාර්මාර්ග ප්‍රදේශවල වගා පිරිවැය අඩුය. කෑගල්ල දිස්ත්‍රික්කයේ පිරිවැය පිළිබඳව ද මෙම තත්ත්වය දක්නට ලැබේ.

සියලුම ප්‍රදේශවල ශ්‍රමය ප්‍රධාන යෙදවුම් බවට පත්ව ඇත. එය යෙදවුම් වියදමින් සියයට 55 කට හිමිකම් කියයි. සී සෑම, පැළ සිටවීම, වගා ආරක්ෂාව සහ අස්වනු නෙළීම යන සියලුම කටයුතුවලට ශ්‍රමය සඳහා අවශ්‍ය පිරිවැය ඉහළ මට්ටමක පවතී. පිළිවෙලින් සියයට 12 කට හා 10 කට හිමිකම් කියන ගොවිපොළ බලය හා පොහොර පිළිවෙලින් දෙවන සහ තෙවැනි තැනට පත්වී ඇත. 2001 යල කන්නයේදී, ඩීසල් මිල ඉහළ යෑම නිසා (විශේෂයෙන් ට්‍රැක්ටර් සඳහා) ගොවිපොළ බලය සඳහා අවශ්‍ය පිරිවැය 14% දක්වා ඉහළ ගොස් ඇත.

### ආ). අස්වැන්න හා ආදායම

සමීක්ෂණ වාර්තා අනුව වාරි පෝෂිත ප්‍රදේශවල සාමාන්‍ය අස්වනු-ප්‍රමාණය බුසල් 60 ක් වන අතර වර්ෂා පෝෂිත ප්‍රදේශවල එය බුසල් 40ක් වේ. මනා කළමනාකරණය වානිජමය වගා රටාව යන හේතුන් නිසා මහාවාර්මාර්ගයන් හි අස්වැන්න වර්ෂා පෝෂිත හා සුළු වාර්මාර්ග ක්‍රමවලට වඩා වැඩි වී ඇති අතර සුළු වගා බිම් කට්ටි බිහිවීම අඳගොවිතැන හා අයහපත් වගා රටාවන් ආදිය නිසා වර්ෂා පෝෂිත ප්‍රදේශවල අස්වැන්න පහළ බැස ඇත.

වෙළෙඳපොළ මිල අගය අනුව දළ ආදායම ඉහළ මට්ටමක තිබුනේ වාර්මාර්ග සහිත ප්‍රදේශවල පමණි. වැසි දියෙන් වගා කරන ප්‍රදේශවල පහළ ඵලදායිතාවය හා අකාර්යක්ෂම වගාරටාව නිසා පාඩු ලබන තත්ත්වයක තිබිණ.

## ඇ). ලාභදායක බව

දිස්ත්‍රික්ක දෙකෙහි සාමාන්‍ය අස්වැන්න ගොවිපළ මිල හා දළ ආදායම් අනුව වී වගාව ලාභදායී ව්‍යාපාරයක් වී ඇත්තේ වාරි පෝෂිත ප්‍රදේශවල වන අතර එයට මනා කළමනාකරණය හා වානිජමය වගා රටාව හේතු වී ඇත. එහෙත් අස්වැන්න අඩුවීම හා අකාර්යක්ෂම වගා රටාවන් නිසා වර්ෂා පෝෂිත ප්‍රදේශවල වී වගාව පාඩු ලබන ව්‍යාපාරයක් බවට පත්ව තිබේ.

## 3. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ආර්ථිකය විවිධාංගීකරණය සඳහා ගොවිපොළ නොවන අංශයේ දායකත්වය, ශක්‍යතාවයන් හා ගැටළු

**පර්යේෂක**

එස්.ආර්. බණ්ඩාර මහත්මිය
ආර්.එල්.එන්. ජයතිස්ස මහතා

ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන මගින් සපයනු ලබන ගොවිපොළ නොවන අංශයේ නිෂ්පාදන හා රැකියා කටයුතු මගින් සුළු ගොවි ප්‍රජාවගේ ආර්ථිකය විවිධාංගීකරණය හා ජීවන මට්ටම් උසස් කිරීමේ හැකියාවන් සොයා බැලීම මෙම අධ්‍යයනයේ ඉලක්කය වේ.

### අරමුණු

සුළු ගොවි අංශයේ ගොවිපොළ නොවන කටයුතුවල වැදගත්කම විමර්ශනය කිරීම හා ග්‍රාමීය කුටුම්භයන්හි මුළු ආදායම වර්ධනය කිරීම සඳහා ආදායම් මාර්ග, රැකියා අවස්ථා සැපයීමේ හැකියාව කෙරෙහි එහි බලපෑම අධ්‍යයනය කිරීම මෙහි සමස්ත අරමුණ විය. මෙහි විශේෂිත අරමුණු පහත සඳහන් පරිදිය.

### විශේෂිත අරමුණු

i. නිෂ්පාදනය, රැකියා හා ආදායම් උත්පාදනය අනුව තෝරාගත් ප්‍රදේශවල ගොවිපළ නොවන අංශයේ ප්‍රමාණය ඇගයීම.
ii. ප්‍රතිපත්ති, ආයතනික සහාය තාක්ෂණය හා යටිතල පහසුකම්, (මාර්ග හා සන්නිවේදනය වැනි) සැපයීමේදී සංරෝධක හඳුනා ගැනීම.
iii. තෝරාගත් ප්‍රදේශයන්හි ගොවිපළ නොවන ආර්ථිකයන් ඉස්මතුවීමට බලපාන සාධක හඳුනා ගැනීම.
iv. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ගොවිපළ නොවන අංශයේ සංවර්ධනය වේගවත් කිරීම සඳහා ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ සකස් කිරීම.

### ක්‍රමවේදය

මෙම අධ්‍යයන ක්‍රමවේදයේ ප්‍රධාන පදනම වන්නේ මෙම විෂය පිළිබඳ ප්‍රකාශිත තොරතුරු ය.

### මූලික සොයා ගැනීම්

දියුණුවන රටවල් බොහොමයක, දේශීය ආර්ථිකය ගොඩනැංවීම සඳහා සංස්කෘතික අංශ සහ සමාජ ආර්ථික වාතාවරණය විසින් ගොවිපොළ නොවන ආර්ථික කටයුතු පිළිගෙන තිබේ. නිදසුනක් ලෙස කෘෂිකර්මය ප්‍රධාන ආර්ථික කටයුත්ත ලෙස සලකන වියට්නාමය ගොවිපොළ නොවන කටයුතු සඳහා සමුපකාර ඇතිකර පවුලේ ආදායම වැඩිකර ගැනීම සඳහා ගොවිපොළ නොවන කටයුතු වර්ධනය කර ගැනීමට සිය සාමාජිකයන්ට උපදෙස් හා ආධාර ලබාදේ. සාමූහිකයේ කෘෂිකාර්මික නිෂ්පාදනයෙන් හා ගොවිපොළ නොවන කටයුතුවලින් ලැබෙන ආදායම ශ්‍රමය වැයකළ ආකාරයට සාමාජිකයන් අතර බෙදේ.

සමුපකාර මගින් වියට්නාම් ගොවීන් විසින්ම ගොවිපොළ නොවන රැකියා හා ආදායම් උත්පාදන කටයුතු හා ග්‍රාමීය සමාජ කටයුතු සැලසුම් කරන අතර ඔවුහු වෙනත් පුද්ගලයන්ගේ හෝ පුද්ගලික කුටුම්භයන්ගේ තීරණ මත නොයැපෙන්නෝ ය. මේ පිළිබඳව ශ්‍රී ලංකාවට ඇත්තේ සුළු අත්දැකීමකි.

ගොවිපොළ නොවන අංශයේ සංවර්ධනය තුළින් ග්‍රාමීය ගොවියාගේ ආර්ථිකය වර්ධනය කිරීමට හා කෘෂිකාර්මික ගොවිතැන් කටයුතුවලට අමතරව ඔවුන් සතු සැඟවුණ කුශලතා වර්ධනය කළහැකි බවත් සාර්ක් රටවල කරන ලද සිද්ධි අධ්‍යයන රාශියකින් හෙළිවී තිබේ (සර්ඩැප් අධ්‍යයන මාලාව - 107).

## වෙනත් කටයුතු

### මෙම ආයතනයට සහ අනෙකුත් ආයතනවලට කරන ලද සේවාවන්

අංශ ප්‍රධාන ජ්.එම් හේනෙගෙදර මහතා අගෝස්තු 3-4 දිනවල පේරාදෙණියේ පැවැති ජාතික විද්‍යා පදනම සංවිධානය කළ " කෘෂිකාර්මික පර්යේෂණ කළමනාකරණය " පිළිබඳ වැඩමුළුවට සහභාගි විය.

ජ්.එම්. හේනෙගෙදර මහතා, දෙසැම්බර් 09 වැනිදා කුරුණෑගල සණස දිස්ත්‍රික් කාර්යාලයේ දී "ප්‍රජාතන්ත්‍ර වාදය හා සහභාගිත්ව සංවර්ධනය " මැයෙන් දේශනයක් පැවැත්වීය.

අධිපර්යේෂක ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතා ආයතනයේ පර්යේෂණ ව්‍යාපෘති පිළිබඳ දත්ත යැවීමේ කටයුතු සම්බන්ධීකරණය කළ අතර 2001 ඔක්තෝබර් 4-5 දිනවල කාප් (CARP) හා පී.ජ්.අයි.ඒ. විසින් සංවිධානය කළ "ඉන්ෆෝම්" නම් පුහුණු පාඨමාලාවටද සහභාගි විය.

ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතා 2001 ජුනි 15-16 ටාජ් සමුද්‍රා හෝටලයේ පැවති "සහභාගිත්ව ග්‍රාමීය සංවර්ධන ක්‍රම හා ප්‍රවේශයන්, ශ්‍රී ලංකාවේ අත්දැකීම්, වෙනත් **ජයිකා** ව්‍යාපෘති " නම් වැඩමුළුවට සහභාගි විය.

# කෘෂිකාර්මික හා පාරිසරික සම්පත් කළමනාකරණ අංශය

**කාර්ය මණ්ඩලය**

| | | |
|---|---|---|
| ආචාර්ය ඩබ්.ජී. සෝමරත්න | - | අංශ ප්‍රධාන |
| එස්. ධර්මලිංගම් මෙණෙවිය | - | අධි පර්යේෂක |
| එම්.එස්. සේනානායක මහතා | - | සහාය අධි පර්යේෂණ නිලධාරි |
| ආර්.එම්.ජී.කේ.බී. රත්නායක මහතා | - | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි |
| එස්.එම්.ඒ. සමරකෝන් මහතා | - | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි |
| පී.ආර්. වීරක්කොඩි මහත්මිය | - | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි |
| එන්.එස්.ඩබ්. නවරත්න මහතා | - | සංඛ්‍යාන නිලධාරි |
| එස්. ඇපාසිංහ මහතා | - | සංඛ්‍යාන නිලධාරි |
| පී.ඩී.ජේ. ආනන්ද මහතා | - | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි (අධ්‍යයන නිවාඩු) |

## කෙරෙමින් පවතින අධ්‍යයන

**1. ගොවියා මුල්කරගත් කෘෂිකාර්මික සම්පත් කළමනාකරණ (FARM) වැඩ සටහන : අනුරාධපුර දිස්ත්‍රික්කයේ දෙමටවැව ග්‍රාමයෙහි සිදු කෙරෙන දෙවන වටයේ කාර්ය බද්ධ පර්යේෂණ**

**පර්යේෂකයෝ :**

එස්.එම්.ඒ. සමරකෝන් මහතා (සම්බන්ධීකාරක)
ආර්.එල්.එන්. ජයතිස්ස මහතා (සම පර්යේෂක)

ගොවියා මුල්කරගත් කෘෂිකාර්මික සම්පත් කළමනාකරණ (FARM) වැඩ සටහන, ආසියානු කලාපයේ චීනය, ඉන්දියාව, ඉන්දුනීසියාව, නේපාලය, පිලිපීනය, තායිලන්තය, වියට්නාමය සහ ශ්‍රී ලංකාව යන රටවල් අට සහභාගිවන කලාපීය වැඩසටහනක් වේ. ෆාම් වැඩසටහනේ හේන් ගොවිතැන වැනි අස්ථිර කෘෂිකාර්මික පද්ධතියන්හි නියැලෙන සම්පත් හිඟ වැසිදියෙන් කෘෂිකාර්මික කටයුතුවල නියැලෙන ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමේ අරමුණෙන් ක්‍රියාත්මක වේ.

ෆාම් වැඩසටහනේ පළමුවෙනි අත්දැකීම අනුරාධපුර දිස්ත්‍රික්කයේ තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රියාත්මක විය. මෙම මැදිහත් වීම 1997 දී ආරම්භ වූ අතර එය 1999 දක්වා පැවැත්විණ. තිරප්පනේ ලැබුණු අත්දැකීම් අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේම ගමක් වන දෙමටවැව කෘෂිකාර්මික නිෂ්පාදනය වර්ධනය කිරීමටත්, ස්වභාවික සම්පත් සංරක්ෂණය සඳහා ගොවියන්ගේ මැදිහත්වීම වර්ධනය කිරීමත් මෙම ව්‍යාපෘතියෙන් උත්සාහ කෙරේ.

**ව්‍යාපෘතියේ අරමුණු**

ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ තෝරාගත් ගමෙහි සම්පත් හිඟ ගොවීන්ට සමාන හා තිරසාර සංවර්ධනයක් උදාකර ගැනීමට හැකියාව ලබාදීමයි. පහත සඳහන් නියත අංශවල ක්ෂුද්‍ර මට්ටමේ සංවර්ධන මැදිහත් වීම් ව්‍යාපෘතියෙන් අපේක්ෂා කෙරේ.

- තෝරාගත් ගමෙහි පස් සහ ජල සංරක්ෂණයට පහසුකම් සැපයීම.

- ගමෙහි ඇති ගොවිපළ හා ස්වාභාවික සම්පත් උපයෝගී කරගනිමින් ප්‍රයෝජනයට ගැනීම දිරිමත් කිරීම.

- කුඹුරු ඉඩම්වල, ගොඩ ඉඩම්වල හා හේන් ගොවිතැනෙහි ගොවිපළ ඵලදායිත්වය වර්ධනය කිරීම සඳහා අවශ්‍ය යෙදවුම් හා තාක්ෂණය ලබා දීම.

- ගමෙහි සම්පත් හිඟ ගොවියන් වෙළෙඳපළ සමෝදාන කටයුතුවලට උනන්දුකරවීම හා එමගින් ව්‍යාපාරික හැකියාවන් දියුණු කර ගැනීමට දිරිගැන්වීම.

- ගොවීන්ගේ ආර්ථික හා සමාජ සුභසාධනය වර්ධනය කිරීම.

ඉහත සඳහන් කළ අරමුණු අවධාරණය කරමින් වත්මන් ග්‍රාම් වැඩ සටහන සකස් කර ඇත. මෙබඳු උත්සාහයක් පෙර කරන ලද තිරප්පනේ වැඩ සටහනේදීත් දරනු ලැබීය. එම ව්‍යාපෘති ප්‍රදේශය " කෘෂිකර්මය මගින් වත්මන් ආදායම් උත්පාදනය කිරීමේ කටයුතු පහත් මට්ටමක පැවැතියත්, ග්‍රාම් මැදිහත්වීම නිසා ගොවිපළ තුළ ජීවවිද්‍යාත්මක හා මානව ප්‍රාග්ධනය වර්ධනය වී ඇත " යනුවෙන් නිරීක්ෂණය කර ඇත. මෙම නිරීක්ෂණය අනුව, ග්‍රාමීය ආර්ථිකයේ එක සමාන ප්‍රදේශවල සම්පත් හිඟ ගොවීන්ගේ ජීවන රටාව දියුණු කිරීමට එබඳු ආකාරයේ ගොවිපොළ මැදිහත් වීමක් සිදු කිරීම යුක්ති සහගත යැයි නිගමනය කළ හැකිය.

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය හා වෙනත් ආයතන සමඟ 2001 දී කරන ලද ව්‍යාපෘති කටයුතු**

- සහභාගිත්ව ගැමි පිරිසුම.
- සහභාගිත්ව ඇගයීම් සැළසුම් කිරීමේ අභ්‍යාස (ග්‍රාම සංවර්ධන සැලසුම්)
- ග්‍රාම් සංකල්ප හා උපාය මාර්ග පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම.
- සමාජ සජීවීකරණය පිළිබඳ විධිමත් හා අවිධිමත් පුහුණුව.
- ජනතා සහභාගිත්වය සඳහා ප්‍රාදේශීය පහසුකම් සපයන්නෙකු / ක්ෂේත්‍ර සම්බන්ධීකාරවරයෙකු පත්කිරීම.
- අලෙවිය හා ව්‍යාපාර සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වීම.
- වී හා (මිරිස්,මාළුමිරිස්, බීට්, ගෝවා ආදී) අතුරු භෝග පිළිබඳ ගොවිපොළ ආදර්ශන පැවැත්වීම.
- (අඹ,දෙහි,දොඩම්) වැනි දියුණු කළ රෝපණ ද්‍රව්‍ය ලබාදීම.
- පස සංස්කරණ වැඩසටහන (උදා : පස්වැටි බැඳීම)
- ජීව ආරක්ෂණ වාරි ක්‍රම (දියබිඳු වාරි ක්‍රමය මගින් පැළ වර්ග ආරක්ෂා කිරීම).
- මී මැසි පාලන වැඩසටහන (මී මැසි පෙට්ටි 25 ක් ගොවීන් අතර බෙදාදීම).
- මී මැසි පාලන, බීජ නිෂ්පාදනය, බිම්මල් වගා සහ අනෙකුත් ක්ෂේත්‍ර භෝග වගාවන් පිළිබඳ පුහුණු පාඨමාලා පැවැත්වීම.
- පස සංරක්ෂණය හා දියබිඳු වාරි ක්‍රමය පිළිබඳ පුහුණු පාඨමාලාව.
- කෘෂි ළිං යටතේ එළවළු ගොවිතැන.
- ගොවීන්ගේ ක්ෂේත්‍ර දිනය.
- මුළුතැන්ගෙය සංවර්ධන වැඩසටහන.
- කාන්තා සංවර්ධන සමාජ පිහිටුවීම හා කණ්ඩායම් ඉතිරිකිරීම් හඳුන්වාදීම.
- ඖෂධීය පැළ එකතු කිරීමේ කමිටුවක් පිහිටුවීම.
- කාන්තා සහභාගිත්වය හා කණ්ඩායම් ඉතිරිකිරීම් පිළිබඳ පුහුණු පාඨමාලාව
- ඖෂධීය පැළවල වැදගත්කම හා අලෙවිය පිළිබඳ පුහුණු පාඨමාලාව.

## 2. ශ්‍රී ලංකාවේ ගිවිසි ගොවිතැන වෙළඳපොළ සමෝදානයේ විභවතාවයන් හා ප්‍රශ්න.

**පර්යේෂකයෝ :**
ආචාර්ය ඩබ්.ජ්. සෝමරත්න (සම්බන්ධීකාරක)
ආර්.එම්.ජ්.කේ.බී. රත්නායක (සම පර්යේෂක)

**හැඳින්වීම :**

වෙළෙඳපොළ හිතකර ප්‍රවේශය මගින් සංවර්ධනය කිරීමේ ආශාව බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල් පිළිගත්තේ වී නමුදු ගිවිසි ගොවිතැන හෝ බාහිර වගාකරුවන්ගේ යෝජනා ක්‍රමය වැනි ක්ෂුද්‍ර මට්ටමේ මැදිහත්වීම්වල ප්‍රතිරෝදක මගින් අලෙවි සමෝදාන සංවර්ධන ක්‍රියාවලිය වර්ධනය වන්නේදැයි යන්න පිළිබඳව අවධානයක් ඇති වීම පසුගිය වසරවලදී දක්නට ලැබුනේය. විවෘත ආර්ථිකය හෝ නිදහස් ප්‍රතිපත්ති රාමුව යටතේ රාජ්‍ය අංශයේ පමණක් නොව පෞද්ගලික අංශයේ ද ආර්ථික සංවර්ධනයේ කොටස්කරුවෝ වෙති. කෙසේ වුවද කෘෂිකාර්මික අංශයේ අවප්‍රමාණ වර්ධනයක් මගින් පෙන්නුම් කෙරෙන්නේ සමස්ථ සංවර්ධනයේ ආංශික විභවතාවයන් උපයෝගී කර ගැනීම පෞද්ගලික අංශය විසින් සිදුකර නොමැති බවයි. පෞද්ගලික හා වැවිලි යන දෙඅංශය මගින්ම කෘෂිකර්මය සඳහා අව ආයෝජනයක් සිදු කිරීම මෙම අංශයේ විභවතාවයන් අවම ලෙස ප්‍රයෝජනයට ගැනීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබේ.

**අධ්‍යයනයේ අරමුණු :**

ශ්‍රී ලංකාවේ වැවිලි නොවන කෘෂිකාර්මික අංශයේ උපාය මාර්ග වර්ධනය කිරීම සඳහා අලෙවි සමෝදාන හැකියාවන් හඳුනාගැනීම සඳහා ගිවිසි ගොවිතැනේ (බාහිර වගාකරුවන්ගේ යෝජනා ක්‍රමය) හි විභවතාවයන්, වෙළඳපොළ අවස්ථා හා දුර්වලතා විශ්ලේෂණය කිරීම මෙම අධ්‍යයනයේ පුළුල් අරමුණ වේ.

මෙම අධ්‍යයනයේ නියත අරමුණු පහත පළවේ.

- ග්‍රාමීය අංශයෙහි රැකියා අවස්ථා උත්පාදනය කිරීම සඳහා උපාය මාර්ගයක් ලෙස ගිවිසි ගොවිතැනෙහි අනාගත විභවතාවයන් විමර්ශනය කිරීම.
- ගිවිසි ගොවිතැන ක්‍රියාවලියට සම්බන්ධ වී සිටින එක් එක් හවුල්කරුවා මුහුණ දෙන ප්‍රශ්න හා ලබාගත් ප්‍රතිලාභ විශ්ලේෂණ කිරීම.
- වැවිලි නොවන කෘෂිකාර්මික අංශයෙහි අනෙකුත් විකිණිය හැකි නිෂ්පාදන සඳහා ගිවිසි ගොවිතැනෙහි අත්දැකීම් යොදා ගැනීමට ඇති හැකියාව හඳුනා ගැනීම.
- වැවිලි නොවන කෘෂිකර්මයෙහි විකිණිය හැකි නිෂ්පාදන සඳහා වෙළඳපොළ හා මිල අවධානම අවම කිරීමට ගිවිසුම් සකස් කිරීම වර්ධනය කිරීම පිණිස ගොවීන් හා වෙනත් පෞද්ගලික අංශයේ සහභාගි වන්නන් දිරි ගැන්වීමට පිළියම් උපාය මාර්ග යෝජනා කිරීම.

**2001 වසරේ දී ලැබූ ප්‍රගතිය පහත සඳහන් අයුරින් වේ.**

- ශ්‍රී ලංකාවේ ගිවිසි ගොවිතැනෙහි ව්‍යුහය, ක්‍රියාපිළිවෙත හා ක්‍රියාකාරිත්වය පිළිබඳව මූලික තොරතුරු එකතු කිරීම සඳහා වැවිලි නොවන කෘෂිකාර්මික අංශයෙහි කැපූ මල් හා කැපූ විසිතුරු පැළෑටි උපඅංශයට අයත් එළවළු සඳහා කුළුබඩු පිළිබඳ සිද්ධි අධ්‍යයන 10 ක් පැවැත්වීම.
- වෙළෙඳපොළට සම්බන්ධවීමේදී ඇතිවන අර්බුද හඳුනා ගැනීම හා කෘෂිකාර්මික නිෂ්පාදන වෙළෙඳපොළට යැවීමේදී අනාගතයේදී ගතයුතු පියවර පිළිබඳව අපනයනකරුවන්, ගොවීන් හා වෙනත් අලෙවි නියෝජිතයන් සමඟ සාමූහික සාකච්ඡා පැවැත්වීම.
- වැවිලි නොවන අංශයෙහි ගිවිසි ගොවිතැන් ව්‍යාපෘතිවල දළ බලපෑම් විශ්ලේෂණය කිරීම සඳහා පාලක කණ්ඩායම් සාකච්ඡා පැවත්වීම.
- ඉහළ ආදායම් ලැබෙන හා අපනයන වෙළඳපොළවලට නිෂ්පාදන හඳුන්වා දියහැකි එළවළු, කුළුබඩු, කැපූ මල්, කැපූ විසිතුරු පැළෑටි හඳුනා ගැනීම සඳහා කරන ලද දත්ත විශ්ලේෂණයන්ගෙන් සියයට75 ක් නිම වී ඇත.

2. ව්‍යාපෘති ප්‍රතිලාභ අගය කිරීම හා ප්‍රගති සමාලෝචනය (ආහාර හා කෘෂිකර්ම සංවිධානය / ආහාර සුරක්ෂිතතාව සඳහා විශේෂ වැඩසටහන ටී.සී.පී. / එස්.ආර්.එල්. /8923 (ඩී) : ජල පාලන අංශය)

**පර්යේෂණ කණ්ඩායම :**
ශාමිණී ධර්මලිංගම් මෙණෙවිය (සම්බන්ධීකාරක)
එස්.එම්.ඒ. සමරකෝන් මහතා (සම පර්යේෂක)
පී.ආර්. වීරක්කොඩි මහත්මිය (සම පර්යේෂක)

ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ ශ්‍රී ලංකාවේ විශේෂ වැඩසටහනෙහි අරමුණවන්නේ පරිසරය ආරක්ෂා කරමින් සමානාත්මතාව හා ජනතා සහභාගිත්වය වර්ධනය කරමින් ඵලදායීතාවය දියුණු කිරීමයි. එම ව්‍යාපෘතියේ ජලපාලන අංශය 1999 නොවැම්බර් මාසයේදී වෛකල්පිත වුයේය. ගොවිපොළ තුළ ජලපාලනය කෙරෙමින් විශේෂිත අවධාරණය යොමු කරමින් සුක්ෂම වගාවන් භෝග නිෂ්පාදනය සඳහා තෝරාගත් තාක්ෂණයන් පරීක්ෂා කිරීම හා ආදාර්ශනය කිරීමට මෙම ව්‍යාපෘතිය සැලසුම් කර තිබිණි. එයට අමතරව, ගොවිපොළ දළ ජලපාලනය හා සුක්ෂම භෝග නිෂ්පාදන වර්ධනය කර ගැනීමට ගොවීන්ට ක්‍රියාශීලී ලෙස ආධාර කිරීමට එයින් සැලසුම් කර තිබිණ. නියමු ආදර්ශන ජාතික හා ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන්වලට ව්‍යාප්ත කරන්නේ කෙසේද යන්න පෙන්වා දීම සඳහා වැඩසටහන් ප්‍රතිරෝධක හා ප්‍රතිඵල ක්‍රමානුකූලව විශ්ලේෂණය කිරීම මගින් වැඩසටහන් ඇගයවීම්වලට ලක්කර නිර්දේශයන් ඉදිරිපත් කරනු ඇත.

නියමු ව්‍යාපෘති : කුරුණෑගල දිස්ත්‍රික්කයේ කෝම්බුව හා අඹකොළවැව යන ස්ථානවල පිහිටා ඇත. වැඩසටහනට පහත සඳහන් කටයුතු ද ඇතුළත් ය.

- සෑම කන්නයක් ආරම්භයේදීම මූලික අධ්‍යයනය
- කන්නය මැද අධ්‍යයනය
- කන්නය අවසානයේ අධ්‍යයනය

එම කටයුතුවලින් පහත කාර්යයන් සිදුවෙතැයි අපේක්ෂා කෙරේ.

- සුළුවාර ක්‍රමවල ගොවීන්ගේ ශෂ්‍ය විද්‍යාත්මක ප්‍රශ්න
- යෙදවුම් සැපයීමේ ප්‍රශ්න
- අලෙවි ප්‍රශ්න
- ණයලබාගැනීම, ඉඩම් භුක්තිය, ශ්‍රමය, කාලගුණය හා සංවිධාන ඇතුළු වෙනත් ප්‍රශ්න

2000/2001 මහකන්නයේ හා 2001 යල කන්නයේ අතුරු වාර්තා අනුව ලැබී ඇති මූලික සොයා ගැනීම් වන්නේ,

- **ව්‍යාපෘතිය හා ප්‍රතිලාභීන් පිළිබඳව දැනුවත්කම**
  ව්‍යාපෘතිය ක්‍රියාකරවන්නන් තෝරාගැනීම සැලකිල්ලෙන් කළයුතුය. නැතහොත් ගොවීන් අතර එක්සත්භාවය නැතිවීමට හා ගොවීන් අතර අතෘප්තිය ඇති වීමට එය හේතුවන හෙයිනි. ආරම්භයේදීම ගමේ ප්‍රජාවට ව්‍යාපෘතිය/අරමුණු/ගොවීන්ට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ මනාදැනුවත් භාවයක් ලබාදීම අත්‍යාවශ්‍ය වේ.

- **ගොවි සාමාජිකත්වය**
  සහභාගිත්ව ප්‍රවේශය ව්‍යාපෘති සැලසුම් කිරීමේදී උපයෝගී කරගෙන ඇති නමුදු, එහෙත් ක්‍රියාත්මක වන්නේ ඉහළින් පහළට ගලාගෙන එන ප්‍රවේශයකි.

- **සංවිධාන කටයුතු**
  මුල් අවධියේ විවිධ ආයතන සමඟ කරන ලද සංවාද අතිශයින් දුර්වල තත්ත්වයක පැවැතියේය. මේ නිසා වැඩකටයුතුවල අපැහැදිලි බවක් හා එකම කාර්යය දෙවරක් සිදුකිරීම ආදිය සිදුවිය.

- **ඉහළින් පහළට ප්‍රවේශය**
  නිලධාරීන් හා ගොවීන් අතර පරතරයක් ඇත්තේය. ඉදිකිරීම් අදියරේ දී අරමුදල් බෙදාදීමේදී මේ බව පැහැදිලි විය. කාලීනව වැඩ කිරීමට මේ මගින් බාධා ඇතිවේ. සහභාගිත්ව ක්‍රමවේදයෙන් ලබාගත හැකි ව්‍යාපෘතියේ නම්‍යතාවය මේ මගින් නැතිවේ.

- **ගොවීන් සමඟ දැනුම බෙදාගැනීම වර්ධනය කිරීම**
  නව තාක්ෂණය උපයෝගී කරගන්නා වෙනත් ගොවිපලවල් දැකගැනීමට ගොවීන්ට අවස්ථාව ලැබී නොතිබිණ.

- **පුහුණු අවශ්‍යතා ඇගයීම**
  සමහර ක්ෂේත්‍ර පිළිබඳව තවදුරටත් පුහුණුවීම් අවශ්‍ය බව ගොවීහු පැවසූහ.

- **පහළින් ඉහළට ප්‍රවේශය**
  පහත සඳහන් වන ආකාරයට, ජාතික වැඩසටහනක් ලෙස මෙය ක්‍රියාත්මක කිරීමට පහළින් ඉහළට ප්‍රවේශය අවශ්‍ය වේ.

  ගම ⟶ ප්‍රදේශය ⟶ පළාත ⟶ ජාතික

- **ව්‍යාපෘති සම්බන්ධීකාරක**
  ව්‍යාපෘති සම්බන්ධීකාරකයන් නොමැති හෙයින් ව්‍යාපෘතියේ ප්‍රජාව හා ආයතන ඒකාබද්ධ කිරීම ආරම්භ අවධියේදී දුර්වල තත්ත්වය පැවැතිණි. මේ නිසා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වූ අතර එය ව්‍යාපෘති කළමනාකරණය මාරු කිරීමට ද හේතු විය.

- **ව්‍යාපෘතියේ තිරසාර බව (පශ්චාත් ව්‍යාපෘති ඇගයීම)**
  ව්‍යාපෘතිය අවසන් වී වසර 2 ක් වත් ගිය පසුව ව්‍යාපෘතියේ තිරසාර බව ඇගයිය යුතුය.

## 3. ශ්‍රී ලංකාවේ සුළු ගොවි අංශය වානිජකරණයවීමේදී ගොවි සමාගම්වල කාර්යභාරය

**පර්යේෂකයෝ :**

එම්.එස්. සේනානායක මහතා (සම්බන්ධීකාරක)
ආචාර්ය ඩබ්.ජී. ජයසේන මහතා (සම පර්යේෂක)
ආර්.එල්.එන්. ජයතිස්ස මහතා (සම පර්යේෂක)

**හැඳින්වීම**

පාරම්පරික සුළු ගොවි අංශය වානිජකරණය වූ ලාභ ලබන ආර්ථික ව්‍යාපාරයක් බවට පරිවර්තනය කිරීමේදී ගොවි සමාගම්වල ශක්‍යතාව හඳුන්වාගනිමින් සියලුම දිස්ත්‍රික්කවල ගොවි සමාගම් පිහිටුවීමත්, ශක්තිමත් කිරීමත් අවශ්‍ය බව කෘෂිකර්ම අමාත්‍යාංශය තම කෘෂිකර්ම ප්‍රතිපත්තිය තුළින් පිළිගන්නා ලදී. (කෘෂිකර්ම අමාත්‍යාංශය, 2000, ජයරත්න 2000). වානිජ කෘෂිකර්මයෙහි නියැළෙන පෞද්ගලික අංශයේ බලවත් කණ්ඩායම් දෙකක් ලෙස ව්‍යාපාර ප්‍රජාව සමඟ හවුල් ව්‍යාපාර කිරීම සඳහා ගොවි ප්‍රජාවගේ බලවත් ආර්ථික සංවිධානයක් ගොඩ නැඟීම ගොවි සමාගම්වලින් අපේක්ෂා කෙරේ. යෙදවුම් හිමිකරගැනීම තාක්ෂණය ලබාගැනීම හා වෙළඳපොළ සමෝධානය වැනි ගොවීන් මුහුණපාන ප්‍රධාන අර්බුදවලට විසඳුම් සෙවීමද මෙම සමාගම්වලින් අපේක්ෂා කෙරේ.

පෙර සඳහන් කළ පරිදි කෘෂිකර්ම අමාත්‍යාංශය, සමාජ හා ආර්ථික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා දිවයිනේ විවිධ දිස්ත්‍රික්කවල ගොවිසමාගම් රාශියක් බිහිකර ඇත. කෙසේ වුවද සුළු ගොවි අංශයේ අපේක්ෂිත අරමුණු හා ප්‍රතිලාභ ලැබෙන්නේ ද යන්න විමසා බැලීම සඳහා නිසි ආර්ථික ඇගයීමක් තවමත් සිදුකර නැත. මෙ අනුව බලන කළ වෙළඳපොළ සමෝධානය සඳහා ආයෝජන දිර්ගන්වන උපාය මාර්ගයක් ලෙස ගොවි සමාගම් වැඩසටහන ක්‍රියා කරන්නේ ද යන්න විශ්ලේෂණය කිරීම කාලීන වශයෙන් වැදගත් වේ.

### අධ්‍යයනයේ අරමුණු

සුළු ගොවීන්ගේ කේවල් කිරීමේ හැකියාව ශක්තිමත් කිරීමත්, ඔවුන්ගේ තරඟකාරීබව උසස් කිරීමටත්, පාරම්පරික යැපුම් කෘෂිකර්මය වානිජ කෘෂිකර්මයක් කරා පරිවර්තනය කිරීමත් යන කරුණු උදෙසා ගොවි සමාගම් ලබාදුන් දායකත්වය පිළිබඳ අධ්‍යයනය කිරීම මේ අධ්‍යයනයේ ප්‍රධාන අරමුණු වේ.

### පර්යේෂණ ක්‍රමවේදය

මේ අධ්‍යයනය සඳහා අවශ්‍ය ගුණාත්මක හා ප්‍රමාණාත්මක දත්ත හා තොරතුරු ප්‍රධාන ප්‍රභවයන් දෙකක් ඔස්සේ එකතු කරනු ලැබේ. එනම්,

**( අ) ද්විතීක ප්‍රභව**

ගොවිසමාගම් භාවිතා කරන ලිපි ගොනු හා වාර්තාවලින්, සමාගම්වලට ලැබුන අරමුදල්, ගොවි නිෂ්පාදන මිලදී ගැනීම්, අලෙවි ප්‍රමාණය හා වටිනාකම, සමාගමේ ලාභය හා අලාභය පිළිබඳ දත්ත ලබාගනු ඇත.

**(ආ) විධිමත් හා අවිධිමත් සම්මුඛ සාකච්ජා/සාකච්ජා කිරීම්**

මෙම අධ්‍යයනයට අවශ්‍ය තොරතුරු ලබාගැනීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංයේ සිටින ප්‍රතිපත්ති සම්පාදකයන්, ගොවි නායකයන් හා මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම භාරව සිටින ගොවි සමාගම්වල නිලධාරීන් සමඟ විධිමත් සාකච්ජා පැවැත්වීමට සැළසුම් කර ඇත.

## 2001 වසර තුළදී කරන ලද කටයුතු

අවශ්‍ය තොරතුරු ලබාගැනීමට කුරුණෑගල, මාතලේ, අනුරාධපුර, පොළොන්නරුව හා නුවරඑළිය දිස්ත්‍රික්කවල සමීක්ෂණ පවත්වන ලදී. සමාගම් දහයකින් අටක් මැනවින් ක්‍රියාත්මක වන අතර ඔවුන්ගේ ඉලක්ක කරා ළඟා වීමට උත්සාහ කරයි. ව්‍යාපෘතිය පිළිබඳව මූලික සොයාගැනීම් මෙසේය.

- අදාළ දිස්ත්‍රික්කයෙහි විවෘත වෙළඳපොළේ මිල ගණන් හා සැසඳීමේදී බොහෝ ගොවි සමාගම් සිය සාමාජිකයන්ට හා සාමාජිකයන් නොවන ගොවීන්ට සාපේක්ෂ වශයෙන් අඩු මිලකට ප්‍රධාන යෙදවුම් ලබා දේ.
- සාමාජිකයන්ට පහසුකම් සැළසීම සඳහා බොහෝ ගොවිසංවිධාන (බීජ හා පොහොර වැනි යෙදවුම් ලබාගැනීම. ණය සහ සත්ත්ව පාලන ගොවිතැන සඳහා, ණය යෝජනා ක්‍රම විශාල සංඛ්‍යාවක් ක්‍රියාත්මක කරයි.
- වී, බඩ ඉරිඟු, සෝයා, මිරිස්, එළු ආදී ගොවි නිෂ්පාදන මිලදී ගැනීමේ කටයුතුවල ගොවි සමාගම්වලින් 60% ක් සාර්ථකව නියැළේ.
- ගොවි සමාගම්වලින් 20% ක් ලාභදායක ලෙස පවත්වා ගෙන යන අතර අනෙක් 60% එම තත්ත්වයට ළඟා වී ඇත.

## වෙනත් කටයුතු

### මෙම ආයතනයට සහ අනෙකුත් ආයතනවලට කරන ලද සේවාවන්

### ආචාර්ය ඩබ්.ජ්. සෝමරත්න

- රොටරි සමාජයේ නාගරික ශාඛාව 2001 මාර්තු 28 වැනි දින කොළඹ හිල්ටන් ගොඩනැගිල්ලේදී සංවිධාන කරන ලද ගෝලීයකරණය හා එහි බලපෑම නම් වැඩමුළුවට " ගෝලීයකරණය සහ ශ්‍රී ලංකාවේ කෘෂිකර්මය " නම් පත්‍රිකාව ඉදිරිපත් කළේය.

- ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ වන සම්පත් හා පාරිසරික දෙපාර්තමේන්තුව 2001 දෙසැම්බර්28-29 දිනවල පැවැත්වූ "7 වැනි වාර්ෂික වනසම්පත් හා පරිසර සම්මන්ත්‍රණයේදී" ඉඩම් සෝදාපාළුව, ඉඩම් භුක්ති ක්‍රමයේ බලපෑම, මාතලේ දිස්ත්‍රික්කයේ සිද්ධි අධ්‍යයනයක් යන පත්‍රිකාව ඉදිරිපත් කළේය.

- දෙසැම්බර් මාසයේදී ස්වීඩනයේ, විද්‍යා ඇකඩමි රාජකීය ආයතනයේ පාරිසරික ආර්ථික විද්‍යාව පිළිබඳ බෙයිජර් ආයතනයට ස්වාභාවික සම්පත් කළමනාකරණයේ අර්බුදය, ඉඩම් සෝදාපාළුවේ ප්‍රශ්නය - ශ්‍රී ලංකාවේ කාමැත්තෙන් ලබාගන්නා විනාශය යන පත්‍රිකාව ඉදිරිපත් කළේය.

- 2001 දෙසැම්බර් 28-29 දිනවල ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වන සම්පත් හා පාරිසරික විද්‍යා දෙපාර්තමේන්තුව සංවිධානය කළ හත්වැනි වාර්ෂික වන සම්පත් හා පාරිසරික සමුළුවේදී ඉන්දු ලංකා නිදහස් වෙළඳ ගිවිසුම හා පාරිසරික බලපෑම යන පත්‍රිකාව ඉදිරිපත් කළේය.

- පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පාංශු බාදනය/ඉඩම් සෝදා පාළුව පිළිබඳ නීති සම්පාදන කමිටුවේ සාමාජිකත්වය දැරීම.

### ශාමිණී ධර්මලිංගම මෙණෙවිය සහ එස්.එම්.ඒ. සමරකෝන් මහතා

- 2001 ඔක්තෝබර් මාසයේදී ආ. හා කා. සංවිධානය සංවිධානය කළ ආහාර සුරක්ෂිතතාවය සඳහා ජලපාලන අංශයෙහි විශේෂ වැඩසටහනේදී, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගති සමාලෝචනය ඇගයීම නමින් පත්‍රිකාවක් කියැවූහ.

- 2001 ඔක්තෝබර් මාසයේදී පෙර සඳහන් කළ සංවිධානයම සංවිධානය කළ එනමින් හැඳින්වූ වැඩසටහනේ දී ව්‍යාපෘති කටයුතුවල බාධක විශ්ලේෂණය පිළිබඳ පත්‍රිකාවක් කියැවූහ.

### ශාමිණී ධර්මලිංගම් මෙණෙවිය

- 2001 සැප්තැම්බර් මාසයේදී කෙන්යාවේ විදේශ සංවර්ධන ආයතනය සංවිධාන කළ ඉල්ලුමට අනුකූල ප්‍රවේශය අනුව දිළින්දන් සඳහා තිරසාර ජීවිතයක් ගොඩනැගීම - ජලය සුරැකීම නම් වැඩමුළුවේදී ශ්‍රී ලංකාවේ ජලය සුරැකීමේ ආකාරය පිළිබඳ පත්‍රිකාවක් ඉදිරිපත් කළාය.

### එම්.එස්. සේනානායක මහතා

- ගාල්ලේ ලයිට්හවුස් හෝටලයේදී ආසියානු සංවර්ධන බැංකුව විසින් 2001 ඔක්තෝබර් මාසයේදී සංවිධාන කළ ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර මූල්‍ය වානිජකරණය පිළිබඳ වැඩමුළුවට සහභාගි විය.

**ආර්.එම්.ජ.කේ.බී. රත්නායක මහතා**

- 2001 ජනවාරි මාසයේදී කොළඹ විශ්ව විද්‍යාලයේ උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුව සංවිධාන කළ පැළැටිවල ආශ්‍රිත ආදර්ශන සකස් කිරිමේදී ක්‍රමානුකුල හඳුනා ගැනීමක් කිරීම නම් පුහුණු පාඨමාලාවට සහභාගි විය.

## වාරි ජලපාලන හා ගොවිජන සම්බන්ධතා අංශය

**කාර්ය මණ්ඩලය**

| | | |
|---|---|---|
| ආර්. ද එස්. ආර්යබන්දු මහතා | - | අංශ ප්‍රධාන |
| එම්.එම්.එම්. අහියර් මහතා | - | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි |
| ඩී.ජ. කරුණාරත්න මහතා | - | සංඛ්‍යාන නිලධාරි |

## වෙනත් කටයුතු

**මෙම ආයතනයට සහ අනෙකුත් ආයතනවලට කරන ලද සේවාවන්**

මෙම වසර තුළදී අහියර් මහතා පහත සඳහන් ශාස්ත්‍රීය කටයුතුවල නිරතව ඇත.

- වාරි කළමනාකරණයෙහි තිරසාර සහභාගිත්වය : සමාලෝචනය හා යථා දර්ශන, ශ්‍රී ලංකා ජර්නල් ඔෆ් ඇග්‍රේරියන් ස්ටඩීස් සඟරාවට ඉදිරිපත් කරන ලද ලිපිය.

- කොළඹ ජාතික විද්‍යා පදනමේ කෘෂිකර්ම විද්‍යා කිව්යා කමිටුව සැප්තැම්බර් 09 වැනි දින සංවිධානය කළ ආහාර සුරක්ෂිතතාවයට අනුරූපව කුඩා වැව් පද්ධතිවල සමාජ ආර්ථික හා ආයතනික වැඩමුළුවේදී ආහාර සුරක්ෂිතතාවය හා ශ්‍රී ලංකාවේ කුඩා වැව් පද්ධතිය නම් පත්‍රිකාව ඉදිරිපත් කළ අතර එය මහාචාර්ය එච්.පී.එම්. ගුණසේන විසින් සංස්කරණය කරන ලද ග්‍රන්ථයට ඇතුළත් කරන ලදී.

- වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ශතවර්ෂයක් පිරීම නිමිත්තෙන් පෙබරවාරි 15-16 දිනවල සංවිධානය කරන ලද වාරි මාර්ග පිළිබඳ සම්මන්ත්‍රණයේදී වාරි ජලකළමනාකරණයේ ආයතනික අංග : න්‍යාය හා යථා දර්ශනය විමසීමක් නම් පත්‍රිකාව ඉදිරිපත් කළේය.

- චීනයේ ලැන්ශොවු හි 2001 ජූලි 23 සිට 27 දක්වා පැවැති වැසිදිය උපයෝගී කර ගැනීම පිළිබඳ චීන සම්මන්ත්‍රණයේ දී හා අන්තර් ජාතික වැඩමුළුවේදී, ශ්‍රී ලංකා වැසිදිය උපයෝගී කරගැනීමේ වැඩසටහනේ අත්දැකීම් : වැසි ජලය එකතු කිරීමේ ජනතා සහභාගිත්වය , තාක්ෂණික හා කළමනාකරණ අංශ යන නමින් පත්‍රිකාවක් ඉදිරිපත් කළේය.

- ජර්මනියේ මාන්හිම් නගරයේදී 2001 සැප්තැම්බර් 10-14 දිනවල පැවැති වැසි ජලය රඳවා ගැනීමේ පද්ධති පිළිබඳ අන්තර ජාතික සමුළුවේදී ශ්‍රී ලංකාවේ කඳුකර ජනාවාසවල ගෘහ පාවිච්චිය සඳහා වැසි ජලයෙහි වටිනාකම නම් පත්‍රිකාව ඉදිරිපත් කළේය.

- ජපානයේ ශිගා හිදී නොවැම්බර් 11-16 දිනවල පැවැති ජලාශ සංරක්ෂණය හා කළමනාකරණය පිළිබඳ අන්තර්ජාතික සමුළුවේ, 5 වැනි සැසිවාරයට ජලාශ කළමනාකරණයෙහි සමාජ හා ආර්ථික අංග යන ලේඛනය ඉදිරිපත් කළේය.

# අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය

## කාර්ය මණ්ඩලය

| | | |
|---|---|---|
| සී.පී. හතුරුසිංහ මහත්මිය | - | අංශ ප්‍රධානි |
| ආචාර්ය ඩී. ගමගේ | - | අධි පර්යේෂක |
| එල්.පී. රූපසේන මහතා | - | අධි පර්යේෂක |
| ආචාර්ය පී.අයි. තුඩාව | - | අධි පර්යේෂක |
| ටී. රවිචන්ද්‍රන් මහතා | - | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී |
| ආර්.එම්.ආර්. බණ්ඩාර මහතා | - | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී |
| ටී.ඒ. ධර්මරත්න මහතා | - | සහාය අධි පර්යේෂක (අධ්‍යයන නිවාඩු) |
| ඩබ්.ඩී. වික්‍රමසිංහ මිය | - | පර්යේෂණ නිලධාරිණී (අධ්‍යයන නිවාඩු) |

## නිමකළ අධ්‍යයන

1. **ප්‍රාදේශීය වෙළඳාම වැඩි දියුණු කිරීමේ අධ්‍යයනය**

**පර්යේෂකයෝ :**

| | | |
|---|---|---|
| එල්.පී. රූපසේන මහතා | - | අධි පර්යේෂක |
| ටී. රවිචන්ද්‍රන් මහතා | - | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී |
| ආර්.එම්.ආර්. බණ්ඩාර මහතා | - | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී |

මුදල් සපයන ආයතනය - අපනයන සංවර්ධන මණ්ඩලය

ආරම්භ කරන ලද දිනය - 2001 සැප්තැම්බර්
අවසන් කරන ලද දිනය - 2001 ඔක්තෝබර්

අධ්‍යයනයේ ප්‍රධාන පරමාර්ථ වනුයේ හැකියාවක් ඇති නිෂ්පාදන මිලදී ගන්නන්ගේ අවශ්‍යතාවය පරිදි තොරතුරු සැපයීමයි. සපයන ලද තොරතුරුවලට තාක්ෂණික නියමයන් ඇසුරුම් කරණය, අපනයනයට ඉඩකඩ තිබීම මිල, කුළුබඩු පොල් සහ තේ වල, නීතිමය තත්ත්වයන් ආදිය ඇතුලත් වේ. අපනයන කරුවන් දැනට යුරෝපීය වෙළඳපළට පමණක් සීමාවී සිටියත් අපනයන කටයුතු ආසියානු හා සාර්ක් කලාපවලට ද ව්‍යාප්ත කළ හැකි බව අධ්‍යයනයෙන් හෙළිවිය. සැපයීම ප්‍රමාණවත් නොවීම අවම ප්‍රමිතිය හා අධික බැංකු පොළිය ආදිය ප්‍රධාන ගැටලු වන්නේය. වෙළඳ සල්පිල් මිලදී ගන්නා හා අලෙවිකරන්නා අතර හමුවීම ආදිය ප්‍රමාණවත් නොවේ. මූල්‍යකරණය හා තාක්ෂණික දැනුම නොමැති අපනයනකරුවන් බොහෝ දෙනෙක් විදේශීය හවුල්කරුවන් සමඟ ඒකාබද්ධ ව්‍යාපාර ආරම්භ කිරීමට කැමැත්තක් දක්වන බවද අධ්‍යයනයෙන් සොයා ගෙන තිබේ.

2. **අපනයන සඳහා මැංගුස්ටීන් සංවර්ධනය කිරීම.**

**පර්යේෂක :**

එල්.පී. රූපසේන මහතා (සම්බන්ධීකාරක)
මූල්‍ය සපයන ආයතනය - අපනයන සංවර්ධන මණ්ඩලය

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ මැංගුස්ටීන් නිෂ්පාදනය සහ අලෙවික්‍රමය පිළිබඳ දත්ත එකතු කර විශ්ලේෂණය කිරීමයි. මෙරට ගස් 33,000 දැනට තිබෙන බව ද එමගින් ගෙඩි මිලියන

එකොළහක නිෂ්පාදනයක් ලැබෙන බවද අධ්‍යනයෙන් අනාවරණය විය. ගොවීන් විසින් පෙන්වා දුන් ප්‍රධාන ගැටලු දෙක වූයේ, මෙම පලතුර තිත්ත රසයක් ඇති කරන අතර ගෙඩිය ඇතුළේ සහ පිට පොත්තේ කිරි තිබීමත්, ගෙඩියේ කහපාට ලාටු දැක ගැනීමට හැකිවීමත් ය. නිෂ්පාදනයට පෙර සහ පසුව පර්යේෂණ සහ සංවර්ධන වැඩ කටයුතු දියුණු කිරීම, ගහ අසබඩ හා අත්හරින ලද රබර් ඉඩම්වල නව වගාවන් ප්‍රවර්ධනය කිරීම, ගොවියන් එකතුකරන්නන් හා අපනයනකරුවන් අතර පෙර හා පසු සම්බන්ධතාවන් ගොඩනැගීම යන කරුණු මෙම අධ්‍යයනයෙන් නිර්දේශ කර ඇත.

3. **මාතලේ දිස්ත්‍රික්කය සඳහා අලෙවිකරණ තොරතුරු ක්‍රමය අධ්‍යයනය**

**පර්යේෂකයෝ :**

එල්.පී. රූපසේන මහතා (සම්බන්ධීකාරක)
ආර්.එම්.ආර්. බණ්ඩාර මහතා
ටී. රවිචන්ද්‍රන් මහතා

මූල්‍ය සපයන ආයතනය - ආර්.ඊ.ඒ.පී. කාර්යාලය, මාතලේ.

ආරම්භ කරන ලද දිනය - 2001 ජනවාරි
අවසන් කරන ලද දිනය - 2001 මාර්තු

මාතලේ දිස්ත්‍රික්කය සඳහා උචිත අලෙවි තොරතුරු පද්ධතියක් නිර්දේශ කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. අලෙවි තොරතුරු ඇගැයීමේ සමීක්ෂණයක් සහ කෘෂිකාර්මික නිෂ්පාදනවල නිෂ්පාදන හා අලෙවි පද්ධතිවල තත්ත්වය විශ්ලේෂණය කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන කටයුතු වේ. දිස්ත්‍රික්කය සඳහා අලෙවි තොරතුරු පද්ධතියක් බිහි කිරීම සඳහා පාවුල ක්‍රියාකාරී සැලැස්මක් අධ්‍යයනය මගින් නිර්දේශ කර ඇත.

## කෙරෙමින් පවතින අධ්‍යයන

වෙළඳ වානිජ හා ආහාර අමාත්‍යාංශයට අයත් ජීවන වියදම් විමර්ශන කමිටුවට වෙළඳපොළ තොරතුරු සපයනු පිණිස 1979 දී ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය තුළ පාර්ලිමේන්තු පනතක් මගින් (පෙර අලෙවි හා ආහාර ප්‍රතිපත්ති අංශය නමින් භාවිතා කෙරුණ) අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය පිහිටුවන ලදී. පසුව මෙම කමිටුවෙහි කාර්යභාරය පුළුල් කෙරුණ අතර එය ජාතික ආහාර ආරක්ෂණ කමිටුව නමින් හැඳින්විණ. මෙම කමිටුව ආහාර හා අලෙවි සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විය.

මෙයට අමතරව, රජයේ දෙපාර්තමේන්තු සන්නද්ධ හමුදා, ස.තො.ස. ආහාර ද්‍රව්‍ය ලබා ගන්නා අන්දම ඇගයීමට තවත් කමිටුවක් පත් කරන ලදී. එහි එක් සාමාජිකයෙක් මෙම අංශයෙන් තෝරාගන්නා ලදී.

වසර 2001 සඳහා ඇස්තමේන්තු කළ මුදල රුපියල් මිලියන 3.38 ක් වේ.

අරමුදල සපයන ආයතනය - හෙ.කො.ගො.ප.පු.ආයතනය (භාණ්ඩාගාර අරමුදල).

**නිත්‍ය වැඩසටහන්**

## වෙළඳපොළ බුද්ධිමය හා ආහාර තොරතුරු පද්ධතිය

මෙම අංශයේ ප්‍රධාන කර්තව්‍ය වන්නේ නිවැරදි අලෙවි වාර්තා නිසිකලට ජාතික ආහාර ආරක්ෂණ කමිටුවට හා ආහාර මිලදී ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය පත් කළ ටෙන්ඩර් මණ්ඩලයට සැපයීමයි. එක්

එක් වර්ගයේ ආහාර ද්‍රව්‍ය පිළිබඳ අලෙවි තොරතුරු හා දත්ත එක්රැස් කිරීම, පිටකොටුව, තොටළඟ, දෙමටගොඩ, බොරැල්ල, වැල්ලවත්ත, කිරුළපන, නුගේගොඩ, කඩවත හා කිරිබත්ගොඩ යන කොළඹ හා තදාසන්න ප්‍රදේශවල සිල්ලර වෙළඳපොළවල් 09 යක ද, පිටකොටුවේ තොග වෙළඳපොළෙහි ද සිදු කරනු ලැබේ. මෙම තොරතුරු රැස් කිරීම උදෙසා සංඛ්‍යාන සහකාරවරු 06 දෙනෙක්ද, අනියම් විමර්ශකවරුන් 04 දෙනෙක්ද යොදවා ඇත. එයට අමතරව ප්‍රධාන ආහාර නිෂ්පාදනය කරන හා පරිභෝජනය කරන දිස්ත්‍රික්කවල වෙළෙඳපොළවල් 19 කින් ද දත්ත හා තොරතුරු එක්රැස් කිරීම සඳහා සංඛ්‍යාන සහකාරවරු 06 දෙනෙකු ද, අනියම් විමර්ශකවරු 11 දෙනෙකු ද යොදවා ඇත.

2002 වර්ෂයේදී ආවරණය කළ ප්‍රදේශ වූයේ කුරුණෑගල, නිකවැරටිය, දඹුල්ල, මාතලේ, අනුරාධපුරය, තඹුත්තේගම, පොළොන්නරුව, කළුතර, නුවරඑළිය, මහනුවර, මාරස්සන, හඟුරන්කෙත, බදුල්ල, බණ්ඩාරවෙල, හම්බන්තොට, මාතර, මොණරාගල, අම්පාර, මරදගහමුල හා රත්නපුරය වේ. කොළඹ හා පිටපළාත්වල පවතින තොග හා සිල්ලර මිලද, පිටපළාත්වල පවතින නිෂ්පාදන මිලද සතිපතා පළ කෙරෙන ආහාර ද්‍රව්‍ය විවරණිකාව උදෙසා විශ්ලේෂණය කරනු ලැබේ. මෙම විවරණිකාව සෑම සිකුරාදාවකම නිකුත් කෙරෙන අතර, එමගින් අදාළ දත්ත හා තොරතුරු ප්‍රතිපත්ති සම්පාදකයින්ට කාලීනව සපයනු ලැබේ.

අරමුදල සපයන ආයතනය - හෙ.කො.ගො.ප.පු.ආ. (භාණ්ඩාගාර අරමුදල)

## වසර 2001 ප්‍රගතිය

- සතිපතා ආහාර ද්‍රව්‍ය විවරණිකාව - වසර පුරාම පළ කරන ලදී.
- සතිපතා ආහාර ද්‍රව්‍ය මිල ගණන් ජාතික ආහාර ආරක්ෂණ කමිටුවට සැපයීම උදෙසා - (නොවැම්බර් හා දෙසැම්බර් හැර) වසර පුරාම පළ කරන ලදී.
- මාසික ආහාර තොරතුරු විවරණිකාව - මූල්‍යමය ප්‍රශ්න හේතුකොට ගෙන මෙය පළ නොකරන ලදී.
- දෛනිකව හා සතිපතා අදාළ තොරතුරු මාධ්‍ය වෙත සපයන ලදී.

**රාජ්‍ය ආයතන (අංශය විසින්, මිල පිළිබඳ තොරතුරු සහ අලෙවි තොරතුරු යවන ලද රාජ්‍ය ආයතන)**

1. ජනාධිපති ලේකම් කාර්යාලය
2. කෘෂිකර්ම, සත්ත්ව පාලන හා සමෘද්ධි අමාත්‍යාංශය
3. අභ්‍යන්තර හා බාහිර වෙළඳ අමාත්‍යාංශය
4. ආහාර සහ අලෙවි සංවර්ධන අමාත්‍යාංශය
5. සමුපකාර තොග වෙළඳ සංස්ථාව
6. මුදල් අමාත්‍යාංශය
7. ශ්‍රී ලංකා මහ බැංකුව
8. ලංකා බැංකුව හා මහජන බැංකුව
9. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව - ලක්හඬ, රුහුණු, රජරට හා අනිකුත් සේවාවන්
10. වයඹ සංවර්ධන අධිකාරිය

**පෞද්ගලික අංශයේ ආයතන**

1. පෞද්ගලික ගුවන්විදුලි සේවාවන් - සිරස, ඉසිර (ටී.එල්.එල්. රේඩියෝ), තරු, හිරු එෆ්.එම්.
2. පෞද්ගලික රූපවාහිනී සේවාවන් - එම්.ටී.වී., ටී.එන්.එල්.
3. සෙලාන් බැංකුව
4. එලිෆන්ට් හවුස්

5. සණස
6. පෞද්ගලික සමාගම් හා පුද්ගලයන්

## වෙනත් කටයුතු

### සී.පී. හතුරුසිංහ මිය

- ශ්‍රී ලංකාවේ වී සැපයුම පිළිබඳව ආහාර ආරක්ෂණ කමිටුවට පත්‍රිකාවක් ඉදිරිපත් කළාය.
- භාණ්ඩාගාරයේ පැවති ආහාර සැපයීමේ කමිටුවේ රැස්වීමට සහභාගී වූවාය.

### ආචාර්ය ඩී. ගමගේ

පීඩාවන්ට ලක්ව ඇති ගොවිපළ ක්‍රම : ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ ගොවිපළ ක්‍රම දෙකක තිරසාර භාවයට අදාළ වූ ගැටළු සමහරක් යන ග්‍රන්ථය 2001 දී සම්පාදනය කළේය. එය ආයතනය මගින් ප්‍රකාශයට පත් කරන ලදී.

ශ්‍රී ලංකාවේ ජාතික ආහාර පදනම් කර ගෙන ආහාර ගැනීමේ මග පෙන්වීම් ක්‍රියාත්මක කිරීම නම් මෙරටෙහි සම්පාදිත පත්‍රිකාව 2001 නොවැම්බර් 20 සිට 23 දක්වා බැංකොක් නුවර පැවති ජාතික ආහාර පදනම් කරගත් ආහාර ගැනීමේ මාර්ගෝපදේශ පිළිබඳව ආසියා හා පැසිපික් කලාපීය ආහාර හා පෝෂණ කලාපයේ කලාපීය විශේෂඥ උපදේශක සභාවට ඉදිරිපත් කරන ලදී.

කොළඹ ලෝක ආහාර වැඩ සටහනේ උපදේශක, මෙම උපදේශකත්වය යටතේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ උඩවලව වම් ඉවුරු ව්‍යාප්ති ව්‍යාපෘතියේ පදිංචි පවුල් පිළිබඳව මූලික සමීක්ෂණයක් කිරීමට ආචාර්ය ගමගේ විසින් මඟ පෙන්වන ලදී. ප්‍රශ්නාවලිය සකස් කිරීම, ක්ෂේත්‍ර විමර්ශකයන් පුහුණු කිරීම, දත්ත සංචිත කිරීම, අධීක්ෂණය, දත්ත එකතු කිරීම සහ විශ්ලේෂණය ආචාර්ය ගමගේට පැවරූ කාර්යයන්ය.

ආචාර්ය ගමගේ විසින් ව්‍යවහාරික පර්යේෂණ ක්‍රම, පළාත් හා ප්‍රාදේශීය මට්ටම්වල සංවර්ධන ක්‍රියාකාරකයන් සඳහා අත් පොතක් නම් ග්‍රන්ථය නිම කරන ලදී. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් මෙය ප්‍රකාශයට පත් කරනු ඇත.

### සම්මන්ත්‍රණ සහ වැඩමුළුවලට සහභාගිවීම

- මාර්තු 23 දින ටාජ් සමුද්‍රා හෝටලයේදී පැවති ආසියානු සංවර්ධන බැංකුව විසින් සකස් කරන ලද දේශීය උපාය මාර්ග සහ වැඩ සටහන් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කළ දිළිඳුභාවය අවම කිරීමේ ඉහළ මට්ටමේ සාකච්ඡා සමුළුවට සහභාගි විය.
- සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ සමාලෝචන සහ ප්‍රගති විමර්ශන අංශය පෙබරවාරි 16 දින සංවිධානය කරන ලද ප්‍රතිඵල පදනම් කර ගත් සමෝලෝචන සහ ඇගයීම් පද්ධති පිළිබඳ වැඩමුළුවට සහභාගි විය.
- කොළඹ රේණුකා හෝටලයේ දී මාර්තු 05 දින පැවති සහභාගිත්ව පෝෂණ පර්යේෂණ කිරීමේ ව්‍යාපෘතිය සහ මුල් ළමා අවධියේ ආරක්ෂාව පිළිබඳ වැඩමුළුවට සම්පත්දායකයෙකු ලෙස සහභාගි විය. සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය සහ යුනිසෙෆ් ආයතනය විසින් මෙම වැඩමුළුව සැලසුම් කරන ලදී.

## වී. රවිචන්ද්‍රන මහතා

**පර්යේෂණ හා අධ්‍යයන**

- දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ සංවිධානය හා ක්‍රියාකාරිත්වය පිළිබඳ පර්යේෂණ අධ්‍යයනය
- ප්‍රාදේශීය වෙළඳ ප්‍රචාරණය අධ්‍යයනය
- වෙළඳපොළ බුද්ධිමය සහ ආහාර තොරතුරු ක්‍රම පිළිබඳ ව්‍යාපෘතිය

**යෝජනා**

- 2001 ජනවාරි 31 හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පැවති අධ්‍යයන කවයේ සම්මන්ත්‍රණයට, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන් හි (ආයෝජන කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දක්ෂ ලෙස යෙදවීම පිළිබඳව අධ්‍යයන) ආයෝජන කෘෂිකාර්මික සංවර්ධන ක්‍රමෝපායන් පිළිබඳ විශ්ලේෂණයක් යන පර්යේෂණ යෝජනාව ඉදිරිපත් කරන ලදී.

**පුහුණුවීම්**

- 2001 මාර්තු 26 සිට 28 දක්වා මහඉලුප්පල්ලමේදී පැවති උතුරු මැදපළාතේ ගොවි සංවිධානය සමඟ කෘෂිකාර්මික වෙළඳ ද්‍රව්‍ය අලෙවිකරණය සඳහා සැලසුම් කිරීම සහ සංවිධානය කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුවලට සම්පත් දායකයෙකු ලෙස සහභාගී විය.

- ආහාර සංරක්ෂණ කමිටු රැස්වීම්වලට සහභාගී විය.

**ලිපි**

- 2001 මාර්තු/ජූනි කමනලම් (දෙමළ) සඟරාවට ශ්‍රී ලංකාවේ දිවුල් නිෂ්පාදන සහ අලෙවිය පිළිබඳ ලිපියක් සැපයීම.

## එල්.පී. රූපසේන මහතා

- ඇඹිලිපිටිය විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය පිළිබඳව 2001 දෙසැම්බර් සිට ජූනි දක්වා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ උපදේශකයෙකු ලෙස කටයුතු කළේය.
- යාපනයේ විශ්ව විද්‍යාලයේ නිබන්ධන දෙකක් 2001 මාර්තු සිට සැප්තැම්බර් දක්වා අධීක්ෂණයට ලක් කරන ලදී.
- 2001 ජූනි 14 සමෘද්ධි අධිකාර්ය විසින් සංවිධානය කරන ලද ලොකුළුණු පිළිබඳ වැඩමුළුවට, ලොකුළුණු නිෂ්පාදනය, අලෙවිකරණය සහ අපනයනය පිළිබඳව විග්‍රහයක් මැයෙන් දේශනයක් ඉදිරිපත් කළේය.
- 2001 අප්‍රියෙල් 23 සංවර්ධන පරිපාලන ආයතනය විසින් සංවිධානය කළ ඩිප්ලෝමා පාඨමාලාවට ග්‍රාමීය සංවර්ධනය සහ ප්‍රාදේශීය සංවර්ධනය සඳහා අලෙවිකරණයේ කාර්යභාරය නම් දේශනය පවත්වන ලදී.
- 2001 ජූනි කෘෂිකර්ම අමාත්‍යාංශයට කෘෂි ව්‍යාපාර සංවර්ධනය මැයෙන් වාර්තාවක් ඉදිරිපත් කරන ලදී.

## සංඛ්‍යාලේඛන හා දත්ත සැකසුම් අංශය

**කාර්ය මණ්ඩලය**

| | | |
|---|---|---|
| ආචාර්ය ඩී. තෙන්නකෝන් | - | අංශ ප්‍රධාන |
| කේ.ඩී.එස්. ආර්යසිංහ මහතා | - | දත්ත විශ්ලේෂක |
| ටී.එන්.ආර්. ප්‍රනාන්දු මහතා | - | දත්ත විශ්ලේෂක |
| එම්.ඩී.එල්. සෙනරත් මහතා | - | විශ්ලේෂක/වැඩ සටහන් සම්පාදක |
| ජී.එච්. කරුණාරත්න මහතා | - | පුස්තකාලයාධිපති |
| ශ්‍රීමා කටුගම්පොළ මෙණෙවිය | - | සහකාර පුස්තකාලයාධිපතිනි |

මෙම ආයතනයේ සංඛ්‍යාලේඛන හා දත්ත සැකසුම් අංශය ඒකක තුනකින් සමන්විතය. එනම් දත්ත සංවර්ධන ඒකකය, පරිගණක ඒකකය සහ පුස්තකාලය යි. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික තොරතුරු පිළිබඳ ජාතික තොරතුරු මධ්‍යස්ථානය ලෙස මෙම අංශය කටයුතු කරයි. ඇමරිකානු සංවර්ධන ආයතනයේ අරමුදල් මත මෙම මධ්‍යස්ථානය 1979 දී පිහිටුවනු ලැබීය. ජාතික කෘෂිකාර්මික සංවර්ධනයේ යහපත උදෙසා කෘෂිකර්මය හා ගොවිකටයුතු තොරතුරු එකතු කර ප්‍රචාරණය සඳහා මෙම මධ්‍යස්ථානය සැලසුම් කර ඇත. පර්යේෂකයන්, සැලසුම් කරුවන්, ප්‍රතිපත්ති සම්පාදකයන්, උපාධි අපේක්ෂකයන්, ගොවීන් හා උනන්දුව දක්වන වෙනත් පුද්ගලයන් මෙම මධ්‍යස්ථානයේ තොරතුරු උපයෝගී කර ගන්නා මූලික පිරිස ලෙස හැඳින්විය හැකිය. දත්ත සංවර්ධන හා පරිගණක ඒකක සංඛ්‍යානමය තොරතුරු සැකසීම උදෙසා ඒකාබද්ධව කටයුතු කරනු ලබයි. පුස්තකාලය නාමාවලි තොරතුරු මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කරනු ලබයි.

### 1. දත්ත සංවර්ධන ඒකකය

| | | |
|---|---|---|
| දත්ත විශ්ලේෂකවරුන් | - | 2 |
| දත්ත සහකාර වරුන් | - | 4 |
| අනියම් විමර්ශකවරු | - | 1 |

2001 වසර පුරාම මෙම ඒකකයට දෙදෙනෙකුගෙන් සැදි දත්ත විශ්ලේෂකවරුන්ගෙන්ද, හතර දෙනෙකුගෙන් සැදි දත්ත සහකාරවරුන්ගෙන්ද පූර්ණ සේවාවක් ලැබී තිබුණි. තොරතුරු මධ්‍යස්ථානයේ දත්ත බැංකුව පවත්වා ගැනීම දත්ත සංවර්ධන ඒකකයේ ප්‍රධානතම කාර්ය භාරයයි.

**දත්ත බැංකුව**

දත්ත බැංකුවේ ප්‍රවර්ධනය දත්ත සංවර්ධන ඒකකයේත් පරිගණක ඒකකයේත් ඒකාබද්ධ වගකීම වේ. දත්ත සංවර්ධන ඒකකයේ කාර්ය දෙයාකාර වේ.

**සංවර්ධන දර්ශක බැංකුව**

මෙම දර්ශක රජයේ හා රාජ්‍ය නොවන ආයතනවල සකස් කළ ද්විතීයික සංඛ්‍යාලේඛන හා මූල්‍ය කරගත් දර්ශකයන් වේ. දත්ත එක්රැස් කිරීම හා සැකසීම වසර පුරාම සිදු කරන ලදී. පරිගණක ගත කළ දත්ත බැංකුව තෝරා ගත් දර්ශක පරිගණක ඒකකයේ ගබඩා කරන ලදී.

**ක්ෂේත්‍ර සමීක්ෂණ තුළින් ජනනය කෙරුණු දත්ත කාණ්ඩ ලේඛනාගාරය**

ආයතනය මගින් සිදු කරන ලද පර්යේෂණවල දත්ත පරිගණකය මගින් සකසා මධ්‍යස්ථානයේ දත්ත ලේඛනාගාරයට වසර තුළදී එක් කරන ලදී. ඊට අමතරව ප්‍රශ්නාවලී හා දත්ත සැකසුම් ලේඛන වශයෙන්ද අධ්‍යයනවල දත්ත කාණ්ඩ ලබාගත හැක.

දත්ත බැංකුව ද්විතීයික හා මූලික මාර්ගවලින් දත්ත එක්රැස් කරනු ලබයි. ඒවා අනුසාරයෙන් කෘෂිකාර්මික භෝග, සත්ත්ව පාලනය, ජනගහනය හා වෙනත් අත්‍යාවශ්‍ය සංඛ්‍යාලේඛනවලින් සැදි දත්ත පදනමක් පවත්වා ගනී. 2001 වසර තුළදී කෘෂිකාර්මික භෝගයන්ට අදාළ පහත සඳහන් දත්ත යාවත්කාලීන කරන ලදී.

1. වී, සහල්, නොවන ධාන්‍ය, රනිල භෝග, අල වර්ග, තෙල් සහිත ඇට, කර්මාන්තමය භෝග, කුළුබඩු, එළවළු, පලතුරුවල වගා ප්‍රමාණය, නිෂ්පාදනය හා සාමාන්‍ය අස්වැන්න ප්‍රමාණය පිළිබඳ දත්ත.
2. වී, වෙනත් ධාන්‍ය, රනිල භෝග, කුළුබඩු, අල වර්ග හා තෙල් සහිත ඇට වර්ගවල නිෂ්පාදන පිරිවැය හා ආදායම පිළිබඳ දත්ත.
3. වී, සහල්, වෙනත් ධාන්‍ය, රනිල භෝග, කුළු බඩු, අල වර්ග, තෙල් සහිත ඇට, පශු සම්පත් හා පශු සම්පත් නිෂ්පාදන සහ මත්ස්‍ය නිෂ්පාදන, පිළිබඳ බාහිර වෙළඳ සංඛ්‍යා ලේඛන හා මිල පිළිබඳ දත්ත.
4. විවිධ ආහාර ද්‍රව්‍යවල පාරිභෝජන දත්ත.
5. වී වගාවේ පොහොර යෙදීම, කෘෂි රසායනික භාවිතය හා වගා ක්‍රම පිළිබඳ දත්ත.

මෙම කාලය තුළදී ශ්‍රම භාවිතය පිළිබඳ සංඛ්‍යා ලේඛන සහ වෙනත් වැදගත් සංඛ්‍යා ලේඛනද එකතු කරන ලදී. වසර තුළදී මෙබඳු වාර්තා 78,176 ක් ලැබුණු අතර, එම වාර්තා 78,200 ක දත්ත වසර 2001 තුළ පරිගණක ගත කරන ලදී.

ද්විතීයික දත්ත මාර්ග ලෙස පහත සඳහන් ප්‍රකාශන උපයෝගී කර ගන්නා ලදී.

1. විදේශ වෙළඳ සංඛ්‍යා ලේඛන (1998-1999) රේගු දෙපාර්තමේන්තුව.
2. කෘෂිභෝගවල වගා පිරිවැය (1999 යල සිට 2000 යල දක්වා) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.
3. පාරිභෝගික මුල්‍ය හා සමාජ ආර්ථික සමීක්ෂණය (1996-1997) ශ්‍රී ලංකා මහ බැංකුව.
4. ශ්‍රී ලංකා ශ්‍රම බලකායේ විමර්ශන පිළිබඳ ත්‍රෛමාසික වාර්තා - ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව.

පළාත් කෘෂිකාර්මික දත්ත පදනම පිහිටුවීම පිළිබඳ ආර් 28 ව්‍යාපෘතියේ ආරම්භ කටයුතු පටන් ගත් අතර පර්යේෂණය වසර අග භාගයේදී නිම කරන ලදී. සබරගමුව පළාතේ ගොවි කේන්ද්‍ර මට්ටමේ දත්ත එකතු කිරීම සඳහා ප්‍රශ්නාවලියක් සකස් කරන ලදී.

**දත්ත සඳහා ඉල්ලීම්**

2001 දී දත්ත බැංකුවට තොරතුරු උදෙසා ලැබුණු ඉල්ලීම් සංඛ්‍යාව 87 ක් විය. ආයතනයේ හා බාහිර වූ ඉල්ලුම්කරුවන් සංඛ්‍යාව පිළිවෙලින් 34 ක් සහ 53 ක් විය.

ආයතනයේ විවිධ අංශවලට ලබා දුන් දත්ත ප්‍රමාණය පහත දැක්වේ.

| අංශය | ප්‍රමාණය | % |
|---|---|---|
| කෘෂිකාර්මික සහ පාරිසරික සම්පත් කළමනාකරණ | 08 | 23.5 |
| අලෙවිකරණය, ආහාර ප්‍රතිපත්ති සහ කෘෂි ව්‍යාපාර | 18 | 52.9 |
| කෘෂි ප්‍රතිපත්ති සැලසුම් හා ව්‍යාපෘති ඇගයීම් | 05 | 14.7 |
| වෙනත් | 03 | 8.8 |
| **එකතුව** | **34** | **100** |

**බාහිර ආයතනවල ඉල්ලීම්**

| | | |
|---|---|---|
| අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා යනාදිය | 12 | 22.6 |
| පෞද්ගලික සමාගම් | 11 | 20.8 |
| විශ්ව විද්‍යාල කාර්ය මණ්ඩලය/ශිෂ්‍යයින් | 17 | 32.1 |
| පර්යේෂණ ආයතන | 04 | 7.5 |
| ජාත්‍යන්තර සංවිධාන | 01 | 1.9 |
| බැංකු | 02 | 3.8 |
| මාධ්‍යවේදීන් | 01 | 1.9 |
| පෞද්ගලික අය | 05 | 9.4 |
| එකතුව | **53** | **100.0** |

**දත්ත සැපයීමෙන් ලැබුණු ආදායම**

බාහිර භාවිත කරන්නන්ට දත්ත සැපයීමෙන් ලත් මුළු ආදායම 2001 දී රු.4,347.05 ක් විය. බාහිර අයට නොමිලේ සැපයූ දත්තවල වටිනාකම රුපියල් 2,790.70 ක් වේ, යනුවෙන් ඇස්තමේන්තු කර තිබිණ. ආයතනයේ අංශවලට ලබාදුන් දත්තවල වටිනාකම රුපියල් 2,163.17 ක් වේ.

## 2. පරිගණක ඒකකය

| | | |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ විශ්ලේෂක වැඩසටහන් | - | 1 |
| වැඩසටහන් විශ්ලේෂක | - | 1 |
| වැඩසටහන් විශ්ලේෂක පුහුණුවන්නන් | - | 1 |
| දත්ත ඇතුළත් කිරීමේ ක්‍රියාකරුවන් | - | 4 |
| යතුරු ලේඛිකා/කාර්යාල ලේකම් | - | 1 |

මෙම අංශයෙහි පරිගණක ඒකකය දත්ත සැකසීම හා විශ්ලේෂණ පහසුකම් සපයයි. එයට අමතරව දත්ත බැංකුවේ දත්ත සංවර්ධනය ද මෙම අංශයේ ඒකාබද්ධ වගකීමක් වේ. ඒකකය මගින් පහත සඳහන් ප්‍රධාන කටයුතු තුනක් ඉටු කරනු ලැබේ.

i. දත්ත බැංකුවට දත්ත සැකසීම හා විශ්ලේෂණය.
ii. ආයතනයේ අධ්‍යයනවල දත්ත විශ්ලේෂණය.
iii. පද්ධති සංවර්ධනය.

**දත්ත විශ්ලේෂණය**

මෘදුකාංග භාවිතය මගින් ක්ෂේත්‍ර විමර්ශනයන්හි තොරතුරු විශ්ලේෂණය කරනු ලැබේ. වසර තුළදී පහත සඳහන් අධ්‍යයනයන් පරිගණක ගත කරනු ලැබීය.

1. තිරසාර වැසිදිය කෘෂිකාර්මික පද්ධතිය මගින් කුටුම්භ ආහාර සුරක්ෂිතතාවය වර්ධනය කිරීම.
2. කෘෂිකාර්මික ආහාර ද්‍රව්‍ය විවරණිකාව 1998.
3. ගම්පහ දිස්ත්‍රික්කයේ කොස් ගස් හා ඒවායේ නිෂ්පාදනය පිළිබඳ සමීක්ෂණය.

4. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආ.කා.ස. ව්‍යාපෘතියේ ප්‍රතිලාභ පිළිබඳව ප්‍රගති සමාලෝචනය සහ ඇගයීම් අධ්‍යයනය.

**පරිගණක ගතකළ දත්ත**

මෙය ශ්‍රී ලංකාවේ ආයතන හැටක් පමණ එක්රැස්කළ කෘෂිකාර්මික සහ සමාජ-ආර්ථික දත්ත පවත්වා ගැනීමට සංවර්ධනය කළ ගබඩා කිරීම් සහ ආපසු ලබාගැනීමේ පද්ධතියකි. දත්ත මාලා 50,000කට අධික ප්‍රමාණයක් පරිගණක දත්ත බැංකුවට ඇතුළත් කරන ලදී. ඒවා ග්‍රාහකයාගේ අවශ්‍යතාව අනුව ප්‍රස්ථාර ලෙස හෝ සාමාන්‍ය දත්ත වගු වශයෙන් හෝ ලබාදීමේ හැකියාව දත්ත බැංකුවට ඇත. බාහිර හා අභ්‍යන්තර දත්ත ඉල්ලීම් 70 ක් වසර තුළදී ලැබිණ.

තවද පරිගණක ඒකකය අනිකුත් අංශවල මෘදුකාංග හා දෘඩාංගවල ගැටලු විසඳාලීමටද අවශ්‍ය සහය ලබාදුනි. ආයතනයේ වැටුප් සකස් කිරීමේ කටයුතුද පරිගණක ගත කිරීමට මෙම අංශය කටයුතු කර ඇත.

## 3. ව්‍යාපෘති ඒකකය

ව්‍යාපෘති ඒකකය 1990 දී මෙම ආයතනය තුළ පිහිටුවන ලදී. එමගින් අපේක්ෂා කරනුයේ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික හා ග්‍රාමීය සංවර්ධනය උදෙසා කෘෂිකාර්මික සම්පත් පදනම, ආධාරක සේවා යන්ත්‍රණය හා ආනයනික සංවර්ධනය පිළිබඳව දත්ත හා තොරතුරු ආනුභාවිත අධ්‍යයන මගින් ලබා ගැනීම උදෙසා සමීක්ෂණ හා අධ්‍යයන සැලසුම්කර ක්‍රියාත්මක කිරීමයි.

## කෙරෙමින් පවතින අධ්‍යයන

### 1. කෘෂිකාර්මික දත්ත පදනමක් පිහිටුවීම සඳහා වන සමීක්ෂණ ව්‍යාපෘතිය

**පර්යේෂකයෝ :**

ආචාර්ය බී. තෙන්නකෝන්
ජේ.එම්. හේනෙගෙදර මහතා (සම්බන්ධීකාරක)
කේ.ඩී.එස්. ආර්යසිංහ මහතා
ඊ.එන්.ආර්. ප්‍රනාන්දු මහතා

මෙම ව්‍යාපෘතිය අරමුණු කර ඇත්තේ ප්‍රාදේශීය දිස්ත්‍රික්ක හා පළාත් මට්ටමින් කෘෂිකාර්මික තොරතුරු ලබා ගැනීම උදෙසා ප්‍රතිපත්ති සම්පාදකයින්, පර්යේෂකයින් හා උගතුන්ගේ අවශ්‍යතා ඉටු කිරීමයි. නියමු ව්‍යාපෘතියක් ලෙස රත්නපුර හා කෑගල්ල දිස්ත්‍රික්ක ආවරණය කරමින් සබරගමු පළාත තෝරා ගන්නා ලදී. පහත සඳහන් වන ප්‍රධාන අංශ යටතේ ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමින් දත්ත එකතු කරන ලදී.

1. ජනගහනය හා මූලික තොරතුරු.
2. ඉඩම් භාවිතය (වන වගාව ඇතුළත් වේ).
3. වී හා සියලු භෝග සම්බන්ධ සංඛ්‍යා ලේඛන.
4. පශු සම්පත් සංඛ්‍යා ලේඛන.
5. යෙදවුම් භාවිතය (බීජ හා පොහොර ආදිය).
6. වාරි පහසුකම්.
7. ගොවිජන අංශයට සම්බන්ධ ආයතන.
8. අලෙවිය.
9. කෘෂි ණය හා ආයෝජන.
10. කෘෂිකාර්මික ආයතන හා ව්‍යාපාර.
11. දිළිඳු බව.

ක්ෂේත්‍ර වැඩකටයුතු ආරම්භ කිරීමට පෙර ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙන් පළ කරන ලද වාර්තාවලින් පහත සඳහන් තොරතුරු ලබා ගන්නා ලදී.

1. ප්‍රාදේශීය ඉඩම් භාවිතය - සබරගමුව පළාත - ජාතික මට්ටමින්.
2. දිස්ත්‍රික්ක මට්ටමින් කන්න අනුව බෝග වගා කරන ප්‍රදේශ.
3. දිස්ත්‍රික්ක මට්ටමේ ගවයන් මී ගවයන් සිටින ප්‍රමාණය.
4. දිස්ත්‍රික්ක මට්ටමින් ජනගහන දර්ශක
(සංගණනය කළ වර්ෂවල ජනගහනය, නාගරික ජනගහනය, ජනගහන ඝනත්වය, ස්ත්‍රී/පුරුෂභාවය අනුව උපත් අනුපාතය, ජනවාර්ගික කණ්ඩායම් අනුව සංගණන වර්ෂයේදී ස්ත්‍රී/පුරුෂ අනුපාතය, ආගම් හා වයස් කාණ්ඩ).
5. ජල සම්පත් ප්‍රභවය අනුව දිස්ත්‍රික් මට්ටමේ අස්වැද්දූ, වැපිරූ හා අස්වැන්න ලබාගත් වී වගා ප්‍රමාණ (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුව).
6. දැව පදනම් වූ කර්මාන්ත ප්‍රමාණය (ජාතික, පළාත් හා දිස්ත්‍රික් මට්ටමින්).
7. දැව පදනම් වූ කර්මාන්ත ප්‍රමාණය (ජාතික, පළාත් හා දිස්ත්‍රික් මට්ටමින්).
8. කෑගල්ල හා රත්නපුර දිස්ත්‍රික්කවල ගොවිජන කේන්ද්‍ර පිළිබඳ තොරතුරු සංක්ෂිප්තය.
9. ගොවි සංවිධාන පිළිබඳ විස්තර.
10. කුඩා වාරි මාර්ග පිළිබඳ තොරතුරු.

ඉහත සඳහන් විෂයයන් යටතේ කෑගල්ල හා රත්නපුරය යන දිස්ත්‍රික්වල ගොවිජන කේන්ද්‍ර මට්ටමින් තොරතුරු ලබා ගැනීම සඳහා ප්‍රශ්නාවලියක් සකස් කරන ලදී. ද්විතීයික මාර්ගවලින් තොරතුරු ලබා ගැනීම අවසන් කර ඇත. 2002 පෙබරවාරි අවසානයේ ආරම්භ වූ ක්ෂේත්‍ර කටයුතු වර්ෂ අවසානයේදී අවසන් විය.

**2. ආසියාවේ සුළු ගොවියන් උදෙසා කෘෂිකාර්මික සේවා හා යෙදවුම් සැපයීම ශක්තිමත් කිරීම සඳහා වූ ඒකාබද්ධ වැඩසටහනේ ජාතික වැඩහල, ශ්‍රී ලංකාවේ සිද්ධි අධ්‍යයන හා අත්හදා බැලීම්. එය 2001 පෙබරවාරි 5-10 දිනවලදී ආයතනයේදී පවත්වන ලදී.**

**සම්බන්ධීකාරකයෝ :**

ආචාර්ය ඩී. තෙන්නකෝන්
ආර්.එල්.එන්. ජයතිස්ස මහතා
ආනන්ද සමරකෝන් මහතා

**සර්ඩැප් / එෆ්.ඒ.ඕ. සහභාගි වූවෝ :**

ආචාර්ය සොලයිමන් - අධ්‍යක්ෂ පර්යේෂණ, සර්ඩැප්
සපිකුර් රහමාන් මහතා - සහාය අධි පර්යේෂක, සර්ඩැප්

ආසියාවේ සුළු ගොවීයන් සඳහා කෘෂිකාර්මික සේවා හා යෙදවුම් සැපයීම ශක්තිමත් කිරීම සඳහා ඒකාබද්ධ වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරන ලදී. මෙරටේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සර්ඩැප්/එෆ්.ඒ.ඕ. ආයතනය මගින් මෙම ආයතනයට පවරන ලදුව 1995 දී ආරම්භ විය. කෘෂිකර්මය පදනම් කරගත් ග්‍රාම සංවර්ධන ආයතන ගොඩනැඟීමේ අරමුණින් නියමු ව්‍යාපෘති මගින් ක්‍රියාත්මක කිරීම හා පර්යේෂණ කිරීම මෙම වැඩසටහනේ අරමුණ විය. පහත සඳහන් ප්‍රදේශවල මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක විය.

1. පළමු වටයේ වැඩසටහන - ගලේවෙල පිහිටි මොරගොල්ලාගම.
2. දෙවැනි වටයේ වැඩසටහන - අනුරාධපුර දිස්ත්‍රික්කයේ අඩම්පනේ ගම
3. තුන්වැනි වටයේ වැඩසටහන - මහනුවර දිස්ත්‍රික්කයේ පුස්සැල්ලාව ගම

ආයතනයේදී පෙබරවාරි 5-10 දක්වා පැවති ජාතික වැඩමුළුවේ පරමාර්ථය වූයේ ආයතනය කරන ලද අත්හදා බැලීම්වල ප්‍රතිඵල අන්තර් විශේෂඥයින්, සර්ඩැප් පර්යේෂකයින් සහ ශ්‍රී ලංකාවේ

ප්‍රාදේශීය සැලසුම්කරුවන් හා ප්‍රතිපත්ති සම්පාදකයින් සමඟ හුවමාරු කරගෙන ජාතික සැලසුමක් ක්‍රියාත්මක කිරීමයි. මෙම ව්‍යාපෘතිය මගින් AD බෙදා හැරීමේ පද්ධති යන්ත්‍රණය තව වසර දෙකකට ගොවි ජන කේන්ද්‍ර මධ්‍යස්ථාන බල ප්‍රදේශවල තොරතුරු ලබා ගැනීම සඳහා ක්‍රියාත්මක කිරීම මෙම වැඩමුළුවෙහි මූලික නිගමනය විය. ශ්‍රී ලංකාවේ ක්ෂේත්‍ර මට්ටමේ දී මෙම කටයුත්ත කිරීම සඳහා 2002 - 2007 දක්වා සර්බැප් ක්‍රියාකාරී සැලසුම් උපයෝගී කර ගන්නා ලෙස යෝජනා විය. සර්බැප් සාමාජික රටවලට 2002 - 2007 දක්වා හඳුන්වා දෙනු ලැබූ ආයතන ගොඩනැගීම පිළිබඳ උපදෙස් මාලාවට අවධානය යොමු කළ යුතු බව අවධාරණය කෙරිණි. මහපෙන්වීම්වල අවසාන සටහන මෙසේ කියැවේ.

ග්‍රාම සංවර්ධනයේ මූලික ඉලක්කය දිළිඳුභාවය තුරන් කිරීමයි. කෙසේ වුවද, දිළිඳුභාවයේ ක්‍රියාදාමය සමාජයේ පුළුල් තලයකට මුල් ඇද විහිදුන, එකිනෙකට සම්බන්ධ සංකීර්ණ ක්‍රියාවලියක් වේ. හුදෙක් ක්‍රය ශක්තිය පමණක් නොව කුසලතා, අයිතීන්, සහභාගිත්වය, සවිබල ගැන්වීම, පහසුවෙන් පීඩනයකට ලක්විය හැකිවීම, අර්බුද මැඩ පැවැත්වීමේ ශක්ති ප්‍රමාණය, කුටුම්බය තුළ සම්බන්ධතාවයන් හා ස්ත්‍රී - පුරුෂ සමාජභාවය පිළිබඳ තත්ත්වයක්ද මීට හේතුභූත වේ.

සර්බැප් ග්‍රාම සංවර්ධන රාමුවට එකිනෙක හා සම්බන්ධ වූ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ හා සෘජුවම ඉලක්කගත වැඩසටහන්ද ඇතුළත් විය.

- විවිධ වූ කණ්ඩායම් අතරත්, ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ අතරත් සමානතාවයකින් යුතුව අවස්ථාවන් ඇති කරලීම උදෙසා දිළිඳු ජනතාවට යහපත් වන්නාවූත්, අසාධාරණකමක් සිදු නොකෙරෙන්නා වූත් ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීම.
- බොහෝ රටවල බෝග වගාව, කෘෂි - වන වගාව හා පශු සම්පත් යනාදියෙන් ග්‍රාමීය නිෂ්පාදිතයේ වැඩි කොටසක් සමන්විත වන හෙයින්, ඒ සම්බන්ධ ඵලදායීතාවයේ වර්ධනයක් ඇති කිරීම දිළිඳු ජනතාවගේ ආදායම් ඉහළ නැංවීමට වැදගත්ය. මේ උදෙසා ඔවුන්ට යෙදවුම් ලබා ගැනීම, වෙළෙඳපොළ පහසුව, කලට වේලාවට ලැබීම, තම කටයුතු පිළිබඳ මනා දැනුමක් තේරුමක් තිබීම සහ තාක්ෂණය ඔවුන් සතුවිය යුතුය.
- දිළිඳුභාවය තුරන් කිරීමෙහිලා වඩාත් සඵල ක්‍රියාමාර්ගය වන්නේ ඵලදායී රැකියාවක යෙදීමය. සෑහෙන මට්ටමක ආදායමක් ලබා ගැනීම උදෙසා අවස්ථාවක් ලබා ගැනීමේදී විවිධ රැකියා රටවන්නන්ට යොමුවීමත්, එහිදී විවිධ සංරෝධකයන්ට මුහුණුපෑමත් ග්‍රාමීය දිළිඳුකමට මූලය වී ඇත.
- ග්‍රාමීය පෙදෙස්වල ගොවිතැනෙන්, ගොවිතැන් නොවන කටයුතුවලින් හා විධිමත් නොවන අංශයන්ගෙන් ඉහළ ආදායමක් ලබා ගැනීමට ඉඩම් හා අනිකුත් නිෂ්පාදනයන්ට සම්බන්ධ වත්කම්වලට හිමිකමක් ලබා ගැනීමට ඉඩකඩ පැවතිය යුතුය.
- ග්‍රාමීය ජනතාවට ඵලදායී ජීවිකාවෘත්ති උදෙසා විකල්ප පැවැත්වීමට නම් කාන්තාවන් ද ඇතුළුව විවිධ කණ්ඩායම්වලට පවතින විශේෂිත අවස්ථාවන්ට පිළියම් යොදන කාර්යක්ෂම වූ උපාය මාර්ග පැවතිය යුතුය. ඉඩම් හිඟ දිළිඳු ග්‍රාමීය කුටුම්බ උදෙසා ශ්‍රම භාවිතය තීව්‍ර වන යටිතල පහසුකම් හා මූලික සේවා සංවර්ධන කටයුතු මගින් ආදායම් මාර්ගවල විවිධාංගීකරණයක් ඇති කිරීම වැදගත් ය. එසේම ග්‍රාමීය දිළිඳුන් හට අවශ්‍ය මූල්‍ය සම්පත් හා ණය ලබාදී පවත්වා ගත හැකි ආදායම් උපදවන කටයුතුවල යෙදීමට සැලැස්වීමද ඔවුන්ට සහාය වියහැකි තවත් මඟකි.

ජාතික වැඩමුළුවේ අදහස් හා නිර්දේශ අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරී කොට්ඨාශ 10 ක තවදුරටත් පර්යේෂණ කටයුතු කරගෙන යනු පිණිස ක්‍රියාත්මක වැඩසටහනක් ආයතනයේ පර්යේෂණ කණ්ඩායම විසින් සකස් කරන ලදී. 2002 හා 2003 යන වසර දෙක තුළදී මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

**පුස්තකාලය**

| | | |
|---|---|---|
| පුස්තකාලයාධිපති | - | 1 |
| සහකාර පුස්තකාලයාධිපති | - | 1 |
| පුස්තකාල සහකාර | - | 1 |
| පුස්තකාල සහකාර | - | 2 |

පුස්තකාලයේ ප්‍රධාන අරමුණ වන්නේ මෙම ආයතනයේ පර්යේෂකයින්, වෙනත් ඒ පිළිබඳව උනන්දුවක් ගන්නා පුද්ගලයින් හා ආයතන උදෙසා ගොවිකටයුතු ක්ෂේත්‍රය පිළිබඳව තොරතුරු එකතුකර, ගොනු කර, සුදුසු පරිදි සකස්කර ප්‍රචාරණය කිරීමට ය. වසර තුළදී කාර්ය මණ්ඩලය පුස්තකාලයෙන් පොත් 31 ක්ද, සඟරා කලාප 312 ක්ද ලබාගෙන තිබුණි. යොදවන ලද ආරක්ෂිත පියවර නිසා පුස්තකාලයට පැමිණි අමුත්තන්ගේ සංඛ්‍යාව 21 කට සීමා විය.

**පොත්, සඟරා හා වාර්තා ලබාගැනීම**

වසර තුළදී පුස්තකාලය අලුතින් ලබාගත් පොත් සංඛ්‍යාව 345 ක් විණි. මෙයින් 71 ඍජුවම මිලදීගත් ඒවා වූ අතර, අනෙකුත් 274 හුවමාරු පදනම මත හෝ තිළිණ පදනම මත ලබාගත් ඒවාය. එමෙන්ම වාර ප්‍රකාශන, ප්‍රවෘත්ති හසුන්, වාර්ෂික වාර්තා විශාල සංඛ්‍යාවක් විදේශීය හා දේශීය ආයතනවලින් තිළිණ හෝ හුවමාරු පදනමක් මත ලැබිණි. පුස්තකාලය විදේශීය සඟරා 36 ක ද, දේශීය සඟරා 21 ක ද දායකත්වය මුදල් ගෙවා ලබා ගනී. වසරෙහි අග භාගයෙහි දී පොත් මිල දී ගැනීමද අඩපන විය.

**අන්තර් පුස්තකාල සහයෝගීතාවය**

ඇග්‍රිනෙට් එස්.ඩී.සී.පී. වැඩසටහනට පුස්තකාලය මෙම වසරේ දී ද සහභාගි විය. වසර තුළදී පුස්තකාලය විසින් සඟරා 23 ක පටුනවල් 236 ක් යැවූ අතර, දේශීය සඟරා 26, මෙම යෝජනා ක්‍රමය යාවත්කාලීන කිරීම සඳහා ආයතනයේ පර්යේෂණ නිලධාරීන් අතර ප්‍රශ්නාවලියක් බෙදාහරින ලදී. සියළුම පර්යේෂණ නිලධාරීහු මෙම ප්‍රශ්ණාවලියට පිළිතුරු දුන්හ. පටුනවල් 254 ක් එම සේවයෙන් ලැබිණි. අන්තර් පුස්තකාල ණය පදනම යටතේ පොත් හා සඟරා ලිපි 58 කට ඉල්ලීම් ලැබිණ. මෙම ක්‍රමය යටතේ කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශ නිලධාරීන්ට ද පොත්පත් නිකුත් කෙරිණ.

කාප් පුස්තකාලයෙහි ඇති කෘෂිකාර්මික ග්‍රන්ථ නාමාවලි පදනමට තොරතුරු ලබා දෙන ලදී. එම දත්ත පදනමේ මුද්‍රිත හා විද්‍යුත් පිටපතක් පුස්තකාලය සතුව ඇත. සූචි පත්‍ර ලබාදීම මගින් ජාතික පුස්තකාලය පවත්වාගෙන යනු ලබන ජාතික සූචි එකතුවටද පුස්තකාලය දායක විය. එහි මුද්‍රිත වෙළුම් දෙකක් පුස්තකාලයට ලැබී ඇත. මීට අමතරව කාප් ආයතනයට කාබනික වගාව හා නියඟය පිළිබඳව තොරතුරු ලබා දෙන ලදී. මේ පිළිබඳ විද්‍යුත් නාමාලවලියක් කාප් පුස්තකාලයේ ඇත. පර්යේෂණ කාර්ය මණ්ඩලයට කාප් පුස්තකාලය මගින් පවත්වාගෙන යන 1993 - 1997 වකවානුව තුළ පළ කළ සම්පූර්ණ සඟරා 140 ක් ඇතුළත් විද්‍යුත් පුස්තකාල පහසුකම්වලින් ප්‍රවේශයක් ආයතනයේ පුස්තකාලය මගින් සලස්වා ඇත.

## වෙනත් ක්‍රියාකාරකම්

අංශයේ සංඛ්‍යාන සහායක එන්.පී. ජයනෙත්ති මහත්මිය ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද " මානව සංවර්ධිත දර්ශක පිළිබඳ සංඛ්‍යාන " පුහුණු වැඩසටහනට සහභාගි වූවාය.

# මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය

## කාර්ය මණ්ඩලය

| | | |
|---|---|---|
| අයි. රණසිංහ පෙරේරා මහතා | - | අංශ ප්‍රධාන |
| පී. පියරත්න මහතා | - | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී |
| එන්.එස්.බී. ඇපාකන්ද මහතා | - | සංඛ්‍යාන නිලධාරී |

මෙරට ගොවිකටයුතු ක්ෂේත්‍රයෙහි ජාතික පුහුණු ආයතනය ලෙස මෙම අංශය තුළ තුන් ආකාරයකින් ක්‍රියා කරනු ලැබේ. පළමුවැන්න රටේ ජාතික ප්‍රමුඛතා අනුව සකස් කෙරෙන එහි පුහුණු පාඨමාලාවල කටයුතු සංවිධානය කිරීම හා සම්බන්ධීකරණය කිරීමයි. දෙවැන්න කාලීන ප්‍රශ්න හා අර්බුද පිළිබඳව පුහුණු අවශ්‍යතා ඉටු කිරීම වන අතර, රජයේ අනිකුත් ආයතනවල පුහුණු වැඩසටහන් සැළසුම් කිරීම, පැවැත්වීම හා අගැයීම් කිරීම තෙවැනි කාර්ය භාරය වේ. පුහුණු වැඩසටහන් අන්තර්ගත ගොවිකටයුතු ක්ෂේත්‍රයේ ක්‍රියාබද්ධ පර්යේෂණවලද මෙම අංශයේ නිලධාරීහු නිරත වෙති.

ආයතනයේ පුහුණු වැඩසටහන්වලට කෙටිකාලීන පාඨමාලා, ඩිප්ලෝමා පාඨමාලා, වැඩමුළු හා සම්මන්ත්‍රණ අයත් වේ. පුහුණු අංශයෙන් හා වෙනත් අදාළ පර්යේෂණ අංශවලින් මෙම පුහුණු පාඨමාලා සඳහා සම්පත් දායකයන් බඳවා ගැනේ. අවශ්‍යතා අනුව විශ්ව විද්‍යාලය රජයේ ආයතන හා රාජ්‍ය නොවන ආයතන මහින්ද සම්පත් දායකයන් ලබා ගනු ලැබේ. පුහුණුකිරීමේ ඒකාබද්ධ අංගයක් වන කාර්යබද්ධ පර්යේෂණ ව්‍යාපෘතිද අංශය මහින් සිදු කරනු ලැබේ.

## අවසන් කරන ලද අධ්‍යයන

- **සමාජ සජීවීකරණය ග්‍රන්ථය** - අයි. රණසිංහ පෙරේරා මහතා විසින් ලියා සම්පූර්ණ කොට හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ප්‍රකාශයනයක් ලෙස මුද්‍රණය කොට ඇත. මේ කටයුත්ත 2000 වසරදී ආරම්භ කළ අතර 2001 දී අවසන් කිරීමට බලාපොරොත්තු වේ. පොත සඳහා පදනම් වී ඇත්තේ පුස්තකාල අධ්‍යයන සහ ලේඛකයා විසින් නොයෙකුත් සමාජ සජීවීකරණ අධ්‍යනයන්හි යෙදී සිටියදී එකතුකර ගන්නා ලද අත්දැකීම්ය.

  ශ්‍රී ලංකීය ජනතාව කඩිනම් සංවර්ධනය සඳහා මෙහෙයවීමට අදාළ පර්යේෂණාත්මක ගැටලු සම්බන්ධව මෙහි ලියා පළ කොට ඇත.

  කඩිනම් සංවර්ධනයක් සඳහා ශ්‍රී ලාංකික ප්‍රජාව සජීවීකරණය කිරීමට අදාළ පර්යේෂණාත්මක ප්‍රශ්න ගණනාවක් මෙම ග්‍රන්ථයෙන් සාකච්ඡා කෙරේ. මෙම පොතෙන් සොයා ගන්නා ලද කරුණු අනුව, ශ්‍රී ලංකාවේ ප්‍රධානතම සංවර්ධන ප්‍රතිරෝධකයන් වන්නේ, ප්‍රමාණවත් නොවන ද්‍රව්‍යමය සම්පත්, අවම ඉතිරි කිරීම්, පහත් මට්ටමේ ආයෝජන හෝ වෙනත් ද්‍රව්‍යමය හෝ ආර්ථික ප්‍රතිරෝධක නොව මහ හැරිය හැකි මානව හැසිරීම්වල ප්‍රතිරෝධකයන්ය. අලසකම, අනුන්මත යැපීම්, අක්‍රියශීලීබව, විශ්වාසය කඩකිරීම, බොරුකීම, වංචා කිරීම හා වංකභාවය වැනි සංවර්ධනයට බාධා කරන හැසිරීම් ප්‍රතිරෝධක ගැන සඳහන් කරන මෙම ග්‍රන්ථය ඒවා විසඳා ගතහොත් රටෙහි සමාජ ආර්ථික ප්‍රශ්න පහසුවෙන්ම විසඳා ගත හැකි බවද පෙන්වා දෙයි. විචල්‍යයන් තුනක් සහ නියතයන් හතරක් මහින් මානව හැසිරීම් කටයුතු හඳුන්වා දෙමින්, එම හැසිරීම් තෙරුම් ගැනීමට නව ප්‍රවේශයක් හඳුන්වා දෙමින් ද පොත අවසන් වේ. දැනුම, ආකල්ප සහ ක්‍රියාකාරීත්වය අනුව විචල්‍යයන පහදා දී ඇති අතර පර්සරය, සමාජ පර්ශ්ථිතිය, සම්පත් සහ සම්භවය යනුවෙන් නියතයන් විග්‍රහ කර තිබේ.

## කෙරිගෙන යන අධ්‍යයන

### සමාජ සජීවිකරණය ග්‍රන්ථය - වෙළුම 2.

සමාජ සජීවිකරණය වෙළුම 2 සැලසුම් කර තිබෙන්නේ අයි.ආර්. පෙරේරා මහතා විසිනි. ඔහු විසින් ග්‍රන්ථය සඳහා දත්ත සහ තොරතුරු එක්රැස් කරමින් සිටී. එය 2002 වසරේ ප්‍රකාශයට පත් කිරීමට නියමිතයි.

විදේශ කටයුතු අමාත්‍යාංශයේ, මූලික ඉල්ලුම මත අංශය විසින් පහත සඳහන් පාඨමාලා සඳහා නිර්දේශ සහ ද්‍රව්‍ය සූදානම් කරන ලදී.

### කෘෂි අලෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමාව

එල්.පී. රූපසේන මහතා (පාඨමාලා අධ්‍යක්ෂ) සහ ආර්.එම්.ආර්. බණ්ඩාර මහතා (පාඨමාලා සම්බන්ධීකාරක) මේ සඳහා යොමුවී අවශ්‍ය ද්‍රව්‍ය සූදානම් කර ගන්නා ලදී.

### කෘෂි සම්පත් සැලසුම් කිරීම සහ කළමනාකරණය කිරීමේ සහභාගිත්ව සහතික පත්‍ර පාඨමාලාව

ගිරාගම මහතා (පාඨමාලා අධ්‍යක්ෂ) සහ ආර්.එම්.ආර්. බණ්ඩාර (පාඨමාලා සම්බන්ධීකාරක), ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි හා එම්.එම්.එම්. අභියර් යන මහත්වරු (සම්පත් දායක වශයෙන්) පාඨමාලාව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සූදානම් කර ගැනීමට යොමුව සිටිති. මෙම වැඩ සටහන් පැවැත්වෙන දිනයන් විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් තීරණය කරනු ඇත.

### කොළ එළවළු පිළිබඳ අධ්‍යයනය

පර්යේෂණ කණ්ඩායම

පී. පියරත්න මහතා (සම්බන්ධීකාරක)
එම්.එස්. සේනානායක මහතා
ආචාර්ය ඩබ්.එම්.ජේ.බී. ගිරාගම
ආචාර්ය ඩී. තෙන්නකෝන්

කොළ එළවළු ගොවීන්ගේ සමාජ ආර්ථික කරුණු පිළිබඳව අධ්‍යයනයක් සැලසුම් කරන ලද අතර, එහි මූලික කරුණු නිම කර ඇත. මෙම අධ්‍යයනය මඟින් කොළ එළවළු ගොවිතැනේ සමාජ-ආර්ථිකමය කරුණු පමණක් නොව, සනීපාරක්ෂාව හා සෞඛ්‍යයට බලපාන කරුණු, පාරිසරික හා අලෙවිය පිළිබඳ කරුණු ද හඳුනාගැනීම අරමුණු කොට ඇත.

## වෙනත් කටයුතු

- රණසිංහ පෙරේරා මහතා දේශීය පාලකයන් සඳහා ශ්‍රී ලංකා ආයතනයෙහි උපදේශක කොමිටියෙහි සාමාජිකයෙක් ලෙස කටයුතු කළේය.
- ආචාර්ය ඩබ්.එම්.ජේ.බී. ගිරාගම ජාතික කාර්මික අධ්‍යයන ආයතනයෙහි උපදේශක කොමිටියෙහි සහ දේශගුණික වෙනස්වීම් සම්බන්ධ මධ්‍යස්ථානයෙහි උපදේශක කොමිටියෙහි සාමාජිකයෙකු ලෙස කටයුතු කළේය.
- රණසිංහ පෙරේරා මහතා විසින් පුහුණු කිරීම් අගය කිරීම සම්බන්ධ පර්යේෂණ වාර්තාවක් යහපත් පාලනය සහ සංවර්ධනය අගය කිරීමේ අන්ත නම් වූ ජාතික සම්මන්ත්‍රණයට ඉදිරිපත් කර ලදී.
- ගිරාගම මහතා අධ්‍යයන පත්‍රිකා තුනක් පහත සඳහන් සම්මන්ත්‍රණ සඳහා ලබා දී ඇත.
- ඉහළ වායු ස්ථරවල දේශගුණික පරාමිතිය (සුළඟේ වේගය, තුෂාර අංකය, සම්පිණ්ඩතා මට්ටම) වෙනස්වීම සහ රටමැද වර්ෂාපතනයන් අතර සම්බන්ධතාවය පිළිබඳ අධ්‍යයනයක්.

- 2001 නොවැම්බර් මාසයේදී පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික සංගමයට දේශගුණික පරාමිතිය හා උන්නතාංශය අතර සහසම්බන්ධතාව මෝසම් කාල දෙක සඳහා යන මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී.
- දුම්බර මිටියාවතේ වෘක්ෂලතාවන්ට සුළඟේ බලපෑම නමින්, පත්‍රිකාවක් හත්වැනි වාර්ෂික වන හා පාරිසරික සැසිය සඳහා 2001 දෙසැම්බර් මස ඉදිරිපත් කරන ලදී.

**අනෙකුත් රාජ්‍ය සංවිධානයන් සඳහා සපයන ලද සේවාවන්**

- සම්පත් දායකයන් ලෙස රණසිංහ පෙරේරා, ගිරාගම සහ බණ්ඩාර රත්නායක යන පර්යේෂණ නිලධාරි මහත්වරු දේශීය පාලකයන් සඳහා ශ්‍රී ලංකා ආයතනයේ දී පුහුණු වැඩසටහන් නමයක් " වැඩිහිටි පුහුණු ක්‍රම විද්‍යාව " පිළිබඳව පැවැත්වූහ.
- සම්පත් දායකයෙකු ලෙස රණසිංහ පෙරේරා මහතා, " සමාජ සජීවිකරණය සඳහා ග්‍රාමීය සංවර්ධනය" මැයෙන් පුහුණු හා පර්යේෂණ ආයතනයේදී පුහුණු වැඩසටහන් හතරක් පවත්වන ලදී.
- සම්පත් දායකයෙකු ලෙස රණසිංහ පෙරේරා මහතා විසින් " ගොවි සංවිධාන " මැයෙන් පුහුණු වැඩසටහන් තුනක් මහවැලි සංවර්ධන අධිකාරිය සඳහා පවත්වන ලදී.
- සම්පත් දායකයෙකු ලෙස රණසිංහ පෙරේරා මහතා විසින් " මහජන සහභාගිත්වය" මැයෙන් පුහුණු වැඩසටහන් දෙකක් කෘෂි සංවර්ධන අධිකාරිය සඳහා පවත්වන ලදී.
- සම්පත් දායකයෙකු ලෙස රණසිංහ පෙරේරා මහතා 2001 නොවැම්බර් 29 විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ ජාතික විද්‍යා සහ තාක්ෂණ කොමිසම සංවිධානය කළ " ව්‍යවහාර සහ එකිනෙක සම්බන්ධතාව අනුව බැලීම " නම් වූ විද්‍යා වැඩමුළුවට සහභාගි විය.

# 2001 දෙසැම්බර් වන විට කාර්ය මණ්ඩලය

**අධ්‍යක්ෂ**

ආචාර්ය ඇස්.ජ්. සමරසිංහ මහතා
බී.ඒ. (ගෞරව) ශ්‍රී ලංකා
එම්.ඒ. (පෙනිසිල්වේනියා), පී.එච්.ඩී. (කොළඹ)
එල්.එල්.බී. (විවෘත විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකා)

**ප්‍රධාන විෂය ක්ෂේත්‍රය**
කෘෂිකර්ම සමාජ විද්‍යාව, ජනශ්‍රැති හා මානව විද්‍යාව, සාහිත්‍ය සහ කලාව

**නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)**

ආචාර්ය ඩබ්.ජ්. ජයසේන
බී.ඒ. (ශ්‍රී ලංකා), එම්.ඒ. (ශ්‍රී ලංකා), පී.එච්.ඩී. (ඒ.අයි.ටී. , බැංකොක්)

**ප්‍රධාන විෂය ක්ෂේත්‍රය**
ඉඩම් ප්‍රතිසංස්කරණ, ඉඩම් භුක්තිය සහ ජනාවාස, වැව්ලි කෘෂිකර්මය

## කෘෂි සැලසුම් හා ඇගයීම් අංශය

**අංශ ප්‍රධාන**
ජ්.එම්. හේනෙගෙදර මහතා
බී.ඒ. (ශ්‍රී ජයවර්ධනපුර)
එම්.එස්සී. (ඒ.අයි.ටී. , බැංකොක්)

**ප්‍රධාන විෂය ක්ෂේත්‍රය**
කෘෂි අලෙවිය සහ සංවර්ධන සැලසුම්කරණය

**පර්යේෂණ කණ්ඩායම**
ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතා
අධි පර්යේෂක
බී.ඒ. (කොළඹ) එම්.ඒ. (සසෙක්ස්)

**ප්‍රධාන විෂය ක්ෂේත්‍රය**
ප්‍රජා සහ ග්‍රාමීය සංවර්ධනය, ධීවර ආර්ථික කරුණු

එස්.ආර්. බණ්ඩාර මිය
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
බී.ඒ. (ශ්‍රී ලංකා)
එම්.එස්සී. (පී.ජ්.අයි.ඒ.)

**ප්‍රධාන විෂය ක්ෂේත්‍රය**
කෘෂිකාර්මික ආර්ථික විද්‍යාව

එම්.එස්. ශ්‍රී ගෞරී ශංකර් මහතා
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
බී.එස්සී. (මද්‍රාසි), එම්.එස්සී. (මද්‍රාසි)
එම්.එල්. (මද්‍රාසි)
(විදේශ අධ්‍යයන නිවාඩු)

**ප්‍රධාන විෂය ක්ෂේත්‍රය**
ප්‍රායෝගික සංඛ්‍යානය, පරිගනක විද්‍යාව, කෘතිම ඥාණය සහ අලෙවි පර්යේෂණ

ආර්.එල්.එන්. ජයතිස්ස මහතා
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී
බී.ඒ. (කැලණිය)
එම්.ඒ. (රෙඩින්)

**ප්‍රධාන විෂය ක්ෂේත්‍රය**
කෘෂිකර්ම මූල්‍යකරණය, කෘෂිකාර්මික අලෙවිකරණය, ආහාර ද්‍රව්‍ය හා මිල උච්චාවචනය, දිළිඳුකම, ග්‍රාමීය සංවර්ධනය සහ ප්‍රජා සංවර්ධනය, ග්‍රාමීය සංවර්ධනය සහ යෞවනයන්, සම්ප්‍රදායක සංස්කෘතිය හා ගැමියන්.

## වාරිජල පාලන හා ගොවිජන සම්බන්ධතා අංශය

**අංශ ප්‍රධාන**

අයි.ආර්. පෙරේරා මහතා
බී.ඒ. (කැලණිය), එම්.එස්සී. (මිනසෝටා)

**ප්‍රධාන විෂය ක්ෂේත්‍රය**
ජල කළමනාකරණ පර්යේෂණ පිළිබඳ ආර්ථික කරුණු

**පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරීන්**

ආර්. ද එස්. ආර්යබන්දු මහතා
**ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී**
බී.එස්සී. (පන්ජාබ්), එම්.එස්සී. (ඒ.අයි.ටී., බැංකොක්)

**ප්‍රධාන විෂය ක්ෂේත්‍රය**
ජල කළමනාකරණය, වාරිමාර්ග පාංශු විද්‍යාව

එම්.එම්.එම්. අහියර් මහතා
**ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී**
බී.එස්සී. (පේරාදෙණිය)
එම්.පිල්. (ලන්ඩන්)

**ප්‍රධාන විෂය ක්ෂේත්‍රය**
පාංශු විද්‍යාව, ජලපාලනය සහ පාරිසරික ආර්ථික විද්‍යාව

## අලෙවි හා ආහාර ප්‍රතිපත්ති අංශය

**අංශ ප්‍රධානී**
සී.පී. හතුරුසිංහ මහත්මිය
බී.කොම්. (ශ්‍රී ජයවර්ධනපුර)
එම්.එස්සී. (ලන්ඩන්)

**ප්‍රධාන විෂය ක්ෂේත්‍රය**
කෘෂිකාර්මික අලෙවිකරණය

**පර්යේෂණ කාර්ය මණ්ඩලය**

ටී.ඒ. ධර්මරත්න මහතා
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි
බී.ඒ. (පේරාදෙණිය)
එම්.ඒ. (සමාජ අධ්‍යයන ආයතනය) නෙදර්ලන්තය

**ප්‍රධාන විෂය ක්ෂේත්‍රය**

සංවර්ධන ආර්ථික විද්‍යාව හා කෘෂිකාර්මික අලෙවිකරණය.

ආචාර්ය ඩී. ගමගේ මහතා
සහාය අධි පර්යේෂක
බී.ඒ. (ශ්‍රී ලංකා), බී.එල්. (ශ්‍රී ලංකා), එම්.එස්.පී.ඩී. (ක්වීන්ස්ලන්තය)
පී.එච්.ඩී. (විස්කොන්සින්)

**ප්‍රධාන විෂය ක්ෂේත්‍රය**

සමාජ සැලසුම්කරණය, සමාජ ආර්ථික බලපෑම් තක්සේරුකරණය (පූර්ව ව්‍යාපෘති) සහ අනුකූලක වැඩසටහන් ඇගයීම, විදේශ සංචාරක ව්‍යාපාරයේ සමාජ විද්‍යාත්මක කරුණු, සංවර්ධනයේ සමාජමය වෙනස්වීම් සහ දේශපාලනික ආර්ථිකය.

එල්.පී. රූපසේන මහතා
අධි පර්යේෂක
බී.ඒ. (ශ්‍රී ලංකා), එම්.එස්සී. (මැලේසියා)

**ප්‍රධාන විෂය ක්ෂේත්‍රය**

කෘෂිකාර්මික අලෙවිකරණය, සංඛ්‍යා ලේඛන, ආර්ථිකකරණය පිළිබඳ පුරෝකථනය

ටී. රවිචන්ද්‍රන මහතා
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි
එම්.ඒ. (කිව් ස්ටේට් විශ්ව විද්‍යාලය)

**ප්‍රධාන විෂය ක්ෂේත්‍රය**

ශ්‍රී ලංකාව සහ සාර්ක් රටවල් අතර වෙළඳ සබඳතා

ඩබ්.ඩී. වික්‍රමසිංහ මිය
පර්යේෂණ නිලධාරිණී
බී.එස්සී. (පේරාදෙණිය)

**ප්‍රධාන විෂය ක්ෂේත්‍රය**

කෘෂි ආර්ථික විද්‍යාව, ගොවිපොළ කළමනාකරණය

ආර්.එම්.ආර්. බණ්ඩාර මහතා
සහාය අධි පර්යේෂක
බී.ඒ. (ශ්‍රී ජයවර්ධනපුර)
එම්.එස්සී. (පිලිපීනය)

**ප්‍රධාන විෂය ක්ෂේත්‍රය**

කෘෂිකාර්මික අලෙවිකරණය

# කෘෂි සම්පත් කළමනාකරණ අංශය

**අංශ ප්‍රධාන**

අචාර්ය ඩබ්.ජ්. සෝමරත්න මහතා
බී.ඒ. (ශ්‍රී ජයවර්ධනපුර), එම්.එස්සී. (ලන්ඩන්)
පී.එච්.ඩී. (ලාට්‍රොබ්)

**ප්‍රධාන විෂය ක්ෂේත්‍රය**
සංඛ්‍යාන විද්‍යාව සහ කෘෂිකාර්මික අලෙවිකරණය

**පර්යේෂණ කාර්ය මණ්ඩලය**

එස්. ධර්මලිංගම මෙණෙවිය
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිණී
බී.එස්සී. (බරණැස්), එම්.එස්සී. (සස්කචුවාන්)

**ප්‍රධාන විෂය ක්ෂේත්‍රය**
ග්‍රාමීය සංවර්ධනය

එම්.එස්. සේනානායක මහතා
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි
බී.කොම්. (රුහුණු)
එම්.එම්. (ලොස් බානෝස්)

**ප්‍රධාන විෂය ක්ෂේත්‍රය**
කෘෂිකාර්මික ආර්ථික කරුණු හා අලෙවිය

පී.ඩී.ජේ. ආනන්ද මහතා
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි
බී.එස්සී. (ලාට්‍රොබ්)

**ප්‍රධාන විෂය ක්ෂේත්‍රය**
කෘෂිකාර්මික අලෙවිකරණය සහ ව්‍යාප්තිය, ස්වභාවික සම්පත් සහ පාරිසරික ආර්ථික විද්‍යාව, ගොවිතැන හා වාරිමාර්ග කළමනාකරණය.

පී.ආර්. වීරක්කොඩි මහත්මිය
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිණී
බී.එස්සී. (රුහුණු)

**ප්‍රධාන විෂය ක්ෂේත්‍රය**
කෘෂි ආර්ථික විද්‍යාව, ගොවිපොළ කළමනාකරණය

ආර්.එම්.ජ්.කේ.බී. රත්නායක මහතා
ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි
බී.එස්සී. (පේරාදෙණිය)
එම්.එස්සී. (නෙදර්ලන්තය)

**ප්‍රධාන විෂය ක්ෂේත්‍රය**
